# පුස්තකාල ප්‍රවෘත්ති

# நூலகச் செய்திகள் LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

**THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA**


13 වන වෙළුම, 3 වන කලාපය / 1992 ජූලි - සැප්තැම්බර්


மலர் 13 இதழ் 3 யூலை - செப்டம்பர் 1992 Vol. 13, No. 3/1992 July - September









ජාතික පුස්තකාලයට වසර දෙකක් පිරීම නිමිත්තෙන් පැවති පිරිත් පිංකම ද

இரண்டாம் ஆண்டு பூர்த்தியை முன்னிட்டு நடைபெற்ற சமயநிகழ்ச்சி - இலங்கை தேசிய நூலக சேவைகள் சபை

Pirith Ceremony to mark the 2 nd Anniversary of the National Library of Sri Lanka

1992. 04. 27



ජාතික පුස්තකාලයේ පොත් අලෙවි සල විවෘත වූ ද

இலங்கை தேசிய நூலகவளவில் திறந்து வைக்கப்பட்ட நூல்விற்பனை நிலையம்

The opening of Book Stall at The SLNLSB premises

1990. 07. 10 ⇩



# පුස්තකාල ප්‍රවෘත්ති
## நூலகச் செய்திகள் LIBRARY NEWS
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

13 වන වෙළුම කලාපය 3

1992 ජූලි - සැප්තැම්බර්



සංස්කාරක උපදේශක මණ්ඩලය

ඊශ්වරී කොරයා
(සභාපති)

එම්. එස්. යූ. අමරසිරි
(අධ්‍යක්ෂ)

නාලිනී ද සිල්වා
(නියෝජ්‍ය අධ්‍යක්ෂ වැ.බ.)

එච්. එම්. ගුණරත්නබණ්ඩා
(සහකාර අධ්‍යක්ෂ)

ජානකී ප්‍රනාන්දු
(සහකාර අධ්‍යක්ෂ වැ.බ.)

ප්‍රධාන සංස්කාරක
මිල්ටන් මලවිආරච්චි

විශේෂ සංස්කාරක
එච්. එම්. ගුණරත්න බණ්ඩා

ලිපි කටයුතු හා සෝදුපත් කියවීම
යූරිකා පද්මිණී මුණසිංහ

කවර සැලසුම
කේ. එම්. අයි. සවර්ණසිංහ

ඡායාරූප
ප්‍රමිලා ධර්මරත්නම්

කවරය ඉදිරිපස ඡායාරූපය
ප්‍රසන්න සෝමපාල


## ජාතික විඥපන ප්‍රතිපත්තියක වැදගත්කම

පසුගිය දශකය තුළ සංවර්ධිත රටවල ඇති වූ තාක්ෂණික දියුණුව සංවර්ධනය වෙමින් පවත්නා රටවල පුස්තකාල, ප්‍රලේඛන යන විඥපන සේවා ක්ෂේත්‍රයට බෙහෙවින් බලපා ඇත. කිසියම් රටක ආර්ථික, දේශපාලන හා සමාජ සංස්කෘතික අංශයන්හි සාපේක්ෂ වර්ධනයක් ඇති කිරීමෙහිලා පුස්තකාල සතුව ඇති කාර්ය භාරය අතිමහත් ය. සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදනය, පර්යේෂක සහ ප්‍රතිපත්ති තීරකයන්ට අවශ්‍ය වන තොරතුරු ලබාදීම එහිදී ප්‍රමුඛස්ථානයක් ගනියි. එමගින් නිවැරදි සංවර්ධන ඉලක්කයක් උපකල්පනය කර ගැනීමට හැකි වේ.

ජාතික විඥපන ප්‍රතිපත්තියක දී ආවරණය වන විෂය වශයෙන් හඳුනාගෙන ඇත්තේ ජාතික පුස්තකාලයක ක්‍රියාකාරිත්වය, කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් ඇතිවන වෙනස්කම්, විඥපන අවශ්‍යතා සපිරීමේ දී මහජන, අධ්‍යාපන සහ විශේෂ පුස්තකාල සතු කාර්ය භාරයන්, පොදු පාඨක විඥපන අවශ්‍යතා හඳුනාගැනීම හා ගවේෂණය, කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය, සංස්කෘතික කර්මාන්ත යනා දී ජාතික ප්‍රතිපත්ති මගින් ඇති කෙරෙන බලපෑම සහ කලාපීය අන්තර් ජාතික සහයෝගිතාවයට දක්වන දායකත්වය යනාදි කරුණු ය. ඉහත කී කරුණු අනුසාරයෙන් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට උත්සුක වීම කාලෝචිත ය.

අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානය ( International fedaration of Library Associations) පුස්තකාල හා ප්‍රකාශන ක්ෂේත්‍රය වෙනුවෙන් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබන ජාත්‍යන්තර සංවිධානයකි රටවල් 132කින් සමන්විත එම සංවිධානයේ මෙවර වාර්ෂික සම්මේලනය පැවැත්වූයේ අපේ අසල්වාසී රට වන ඉන්දියාවේදී ය. මෙම සමුළුවේ ප්‍රධාන තේමාව වී ඇත්තේ ජාතික විඥපන ප්‍රතිපත්ති සැකසීම වේ. දකුණු ආසියානු රටක මෙම සංවිධානයේ වාර්ෂික සමුළුව ප්‍රථමවරට පැවැත්වීම වැදගත් වනුයේ එමගින් ජාතික මට්ටමේ විඥපන ප්‍රතිපත්තියක් සම්පාදනය කරලීමට අවශ්‍ය වන මූලික අඩිතාලම දැමීමට අනුබල ලැබීම වේ. දකුණු ආසියානු කලාපයේ රටවල පුස්තකාල ක්ෂේත්‍රයේ ඇති ගැටළු සාකච්ඡා කිරීමට මෙය කදිම තෝතැන්නක් වනු ඇත.

විශේෂ සංස්කාරක

## පටුන

කතුවැකිය - 1

පටුන - 2

පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වත්මන් ව්‍යාපෘතිය හා එය සම්පාදනයේ දී මුහුණ දෙන දුෂ්කරතා 3 - 7
ඩබ්ලිව්. එස්. පුණ්‍යවර්ධන මහතා

நூலக நடவடிக்கைகளில் கணனியினது தாக்கமும், பாவனையும் 8 - 11
திரு. எம். பீ. எம். பைரூஸ்

NEWS - 12
පුවත් ලුහුඬින් 13 - 14

University Libraries of Sri Lanka 15 - 18
Mrs. Sumana Jayasuriya

බ්‍රේල් මුද්‍රණාලය සහ ශ්‍රී ලංකාවේ අන්ධ අය සඳහා බ්‍රේල් පොත් ප්‍රකාශනය 19 - 21
ටී. බී. කොස්වත්ත මහතා

පර්යේෂණ හා බැඳුණු සාහිත්‍ය ගවේෂණ සේවා 22 - 23
සුමිත්‍රා තලාකඩ මහත්මිය

# පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය: ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වත්මන් ව්‍යාපෘතිය හා එය සම්පාදනයේ දී මුහුණ දෙන දුෂ්කරතා

**ඩබ්ලිව්. එස්. පුණ්‍යවර්ධන**
සහකාර පුස්තකාලයාධිපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**හැඳින්වීම :**

ඕනෑම රටක අතීතයේ සිට ආරක්ෂා කරනු ලැබූ ග්‍රන්ථ නාමාවලීන් හා පුස්තකාල සූචීන් තිබිය හැකි ය. ඒවා වර්තමානයේ පිළියෙල කෙරෙන ග්‍රන්ථනාමාවලීන් හා සූචීන් වලට බෙහෙවින් වෙනස් වූ ප්‍රාථමික මට්ටමේ ඒවා ය. ඊජිප්තුවේ පැවති ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලයේ ද මෙවැනි ග්‍රන්ථ පිළිබඳ ලැයිස්තු තිබුණු බව Encyclopedia of Library and Information Science හි සඳහන් වේ. එහෙත් පූර්ව කාලීන ග්‍රන්ථනාමාවලී යනුවෙන් අදහස් කරන්නේ එවැන්නක් ම නොවේ. අතීතයේ පැවැති එවැනි සූචීන් ඍජුව ම සම්බන්ධ කර ගෙන හෝ එම පුස්තකාල හා ලේඛනාගාරවල තැන්පත් කොට ඇති පොත්පත් භෞතිකව පරීක්ෂා කොට ඒවායේ අඩංගු ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇසුරින් වර්තමානයේ ග්‍රන්ථනාමාවලී සම්පාදනය කිරීම පූර්වකාලීන ග්‍රන්ථනාමාවලී කරණය වශයෙන් හැඳින්විය හැකි ය.

එල්. එම්. හැරඩ්ගේ පුස්තකාලයාධිපතීන්ගේ පාරිභාෂික ශබ්ද මාලාවට අනුව පූර්වකාලීන ග්‍රන්ථනාමාවලියක් යනු කලින් වර්ෂවල ප්‍රකාශයට පත් කරන ලද පොත් ඇතුළත් වන ග්‍රන්ථනාමාවලියකි. එය ප්‍රවර්තන ග්‍රන්ථනාමාවලියකින් වෙනස් වේ. ප්‍රවර්තන ග්‍රන්ථනාමාවලියක ඇතුළත් වන්නේ කාලීනව ප්‍රකාශයට පත් කරන ලද පොත් ය. ප්‍රවර්තන ග්‍රන්ථනාමාවලිය 'සංවෘත ග්‍රන්ථ' නාමාවලියක් යනුවෙන් ද හැඳින්වේ. (A bibliography which list books published in previous years as distinct from a 'current' bibliography which records books recently published. Also called a closed bibliography.)

ජාතික වශයෙන් රටක පළ වූ පොත්පත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එක්රැස් කොට සම්පාදනය කරනු ලබන ජාතික ග්‍රන්ථනාමාවලියට අමතරව ඉහත සඳහන් කරන ලද අර්ථනිරූපනවලින් අදහස් කෙරෙන පරිදි කිසියම් වකවානුවක් මහහැරී හෝ සිතාමතා අතහැර දැමූ කාලපරිච්ඡෙදයක් තුළ රටෙක පළ වූ පොත් ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන ග්‍රන්ථනාමාවලිය පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය වශයෙන් හැඳින්විය හැකි ය.

**ප්‍රයෝජන :**

අතීත බුද්ධිමය උරුමය වර්තමාන පර්යේෂණ සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලීන් උපකාරී වේ. රටක ජාතික සංවර්ධනයේ දී ඓතිහාසික උරුමයන් විමර්ශනය කිරීම බෙහෙවින් වැදගත් වේ. ඒවා වැළලී යාමට ඉඩ හැරීම ජාතික අපරාධයකි. ඓතිහාසික උරුමයන් ප්‍රයෝජනයට ගැනීමේ දී පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය මාර්ගෝපදේශකයක් වශයෙන් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

තව ද ඒ ඒ වකවානුවල බිහි වූ සාහිත්‍ය පිළිබඳ විශ්ලේෂණයක් කිරීමට ද මෙය උපකාරී වේ. නිශ්චිත කාලපරිච්ඡෙදයක් තුළ තොරතුරු සොයන පර්යේෂකයන්ට හෝ විද්‍යාඥයින්ට මෙය බෙහෙවින් උපකාරී වන මූලාශ්‍රයකි. පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලියට පාදක වූ වර්ෂය තුළ බිහි වූ සාහිත්‍ය මොනවා දැයි විශ්ලේෂණය කළ හැකි වන අතර එම විශ්ලේෂණය තුළින් වර්තමානය හා අතීතය සැසඳිය හැකි වන අතර අනාගතය සැලසුම් කිරීමට ද පුළුවන. මෙහි දී උදාහරණයක් ලෙස 1962 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බිහි වූ සාහිත්‍යය පිළිබඳව සලකා බලන විට සියයට හැත්තෑපහක් පමණ බිහි වී ඇත්තේ ආගම, සමාජ විද්‍යාව හා සාහිත්‍ය යන විෂය ක්ෂේත්‍රයන් තුළින් ය.

කිසියම් කාලපරිච්ඡෙදයක් තුළ දී පළ වූ සුවිශේෂ වූ සාහිත්‍යය අංගයන් මෙන් ම සාහිත්‍ය ලක්ෂණයන් ද මෙමඟින් අධ්‍යයනය කළ හැකි වේ. 1950 දශකයේ මැද භාගයේ දී බිහි වූ කවිකොළ සාහිත්‍යය හා තත්කාලීනව පැවති තුරඟ තරඟ සම්බන්ධයෙන් පළ වූ ප්‍රකාශන ආදිය මෙහි ලා නිදසුන් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය. කාලයාගේ ඇවෑමෙන් මේවා පළ වීම කෙමෙන් අඩු වූ බව පිළිබිඹු කරයි.

ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවලට පූර්වකාලීන ග්‍රන්ථනාමාවලීකරණය අලුත් විෂයයක් වුව ද බටහිර දියුණු රටවල මෙම කාර්යය ආරම්භ කොට දැනට දශක දෙකක් පමණ ඉක්ම ගොස් ඇත. නෙදර්ලන්තය, එක්සත් රාජධානිය හා ස්පාඤ්ඤය වැනි රටවල දීර්ගකාලීන ව්‍යාපෘති වශයෙන් සංවිධානාත්මකව මේවා කර ගෙන යනු ලබයි. අද එම රටවල් පූර්වකාලීන ග්‍රන්ථනාමාවලීන් පළ කිරීම මෙන් ම එමඟින් ඔවුන්ගේ අපේක්ෂිත අරමුණු ද සාක්ෂාත් කර ගෙන ඇත. වර්තමානයේ දී එම රටවල් පරිගණක භාවිත කරමින් පූර්වකාලීන ග්‍රන්ථනාමාවලී සම්පාදන කටයුතු ද නව මඟකට යොමු කරමින් තොරතුරු සේවාවන් හා සම්බන්ධ කොට ඇත. එපමණක් නොව සිය රටේ පූර්වකාලීන ග්‍රන්ථනාමාවලීන්ට අමතරව වෙනත් රටවලින් ආබද්ධ කර ගන්නා ලද එකතූන් සඳහා ද ග්‍රන්ථනාමාවලීන් සම්පාදනය කිරීමට යුහුසුලු වී ඇත. බ්‍රිතාන්‍ය ජාතික පුස්තකාලයේ ශ්‍රී ලංකා එකතුව ද, නෙදර්ලන්ත

ජාතික පුස්තකාලයේ ලන්දේසි පොත් එකතුව ද ඇසුරින් ග්‍රන්ථනාමාවලින් සම්පාදනය කර ඇති අතර මෙම තොරතුරු බෙද හැරීමේ දී තාක්ෂණයේ පහසු වූත් කාර්යක්ෂම වූත් මාධ්‍යය වූ පරිගණකය ඔවුන්ට බෙහෙවින් උපකාරී වී ඇත.

**ශ්‍රී ලංකාවේ පූර්වකාලීන ග්‍රන්ථනාමාවලි සම්පාදනයේ ඓතිහාසික තත්ත්වය :**

ශ්‍රී ලංකාවේ පූර්වකාලීන ග්‍රන්ථනාමාවලි සම්පාදනයේ ඓතිහාසික තත්ත්වය ගැන කතා කිරීමේ දී ආචාර්ය එච්. ඒ. අයි. ගුණතිලක මහතා විසින් 1970 දී සම්පාදනය කරන ලද "A Bibliography of Ceylon" නමැති ග්‍රන්ථනාමාවලිය අමතක කළ නොහැක. එය ශ්‍රී ලංකාවේ පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලි සම්පාදනයේ ආරම්භය යැයි කිවහොත් නිවැරදි ය. ශ්‍රී ලංකාවේ භූගෝලීය තත්ත්වය, ජනතාව, ඓතිහාසික පසුබිම හා සංස්කෘතිය සම්බන්ධයෙන් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන කොට බටහිර දිග භාෂා කීපයකින් 1507 සිට 1967 දක්වා පළ වූ පොත් හා සඟරා ලිපිවල ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර මෙහි අන්තර්ගත වේ. මෙහි ඇතුළත් සෑම සංලේඛයක ම අදළ ප්‍රකාශනය පිළිබඳව කෙටි විස්තරයක් (Annotation) ඇතුළත් කොට තිබේ. අප හඳුන්වන ජාතික ග්‍රන්ථනාමාවලියක ස්වරූපයෙන් මෙය සම්පාදනය කොට නොතිබුණු ද ජාතික වශයෙන් බෙහෙවින් වැදගත් වන සියවස් හතරහමාරක් තුළ ශ්‍රී ලංකාව පිළිබඳව විදේශීය බසින් ලියැ වී ඇති සාහිත්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් මෙහි අන්තර්ගත වී ඇත.

මින් පසුව සම්පාදනය කරන ලද පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලි සියල්ල ම ජාතික මට්ටමින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒවායේ ඓතිහාසික වැදගත් කමක් මෙන් ම නෛතික වටිනාකමක් ද තිබේ. එනම් ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ප්‍රකාශන ඇතුලත් කොට ඒවා සම්පාදනය කරන ලදී. ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති ප්‍රකාශන හෙවත් "මහජනතාව අතර නොමිලේ බෙදහැරීම හෝ විකිණීම සඳහා ඕනෑම ආකාරය කින් සහ ඕනෑම මාධ්‍යයකින් පිළියෙල කරන ලද ප්‍රකාශන" ඇසුරින් පළ කරනු ලබන නාමාවලිය ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය යි.

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය පිළිබඳ ඉතිහාසය ඉංග්‍රීසි පාලන සමය දක්වා දිවේ. 1839 අංක 05 දරණ පුවත් පත් ආඥ පනත ශ්‍රී ලංකාවේ ප්‍රථම නීතිමය තැන්පතු නීතිය ලෙස සැලකිය හැකි ය. මෙම පනත 1951 අංක 18 දරණ පනතින් සංශෝධනය විය. අනතුරුව 1976 අංක 05 දරණ පනතකින් නැවත සංශෝධනය විය.

ශ්‍රී ලංකාවේ පොත් පිළිබඳ නීතිමය තැන්පතු නීතියෙහි ඉතිහාසය 1884 වර්ෂය තෙක් දිවේ. බ්‍රිතාන්‍ය රජය විසින් "මුද්‍රණ කරුවන් සහ ප්‍රකාශකයින්" පිළිබඳ සකස් කරන ලද කෙටුම්පත 1884 නොවැම්බර් 31 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලදී. එය 1885 අංක 01 දරණ "ලංකාවේ මුද්‍රණය කරනු ලබන පොත්පත් වල පිටපත් ආරක්ෂා කර ගැනීම හා එම පොත් ලියාපදිංචිය සඳහා වූ පනත" වශයෙන් සම්මත විය. මෙය 1902 අංක 16 දරණ මුද්‍රණාල අඥපනත නිසා තව දුරටත් ශක්තිමත් විය. 1885 බිහි වූ මෙකී ආඥ පනත 1948, 1951, 1976 හා 1983 යන වර්ෂ වල දී සංශෝධනය වීමෙන් අනතුරුව අද මෙය ප්‍රබල නීතිමය කර්තව්‍යයක් බවට පත්ව ඇත.

1885 සිට අද දක්වා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අදාළ පනතේ 5 වන වගන්තිය අනුව නීතිමය තැන්පතුව සඳහා ලැබෙන ප්‍රකාශනවල විස්තර රජයේ ගැසට් පත්‍රයේ V වන කොටස වශයෙන් පළකරනු ලබයි. එහෙත් එය පරිපූර්ණ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයක් නොවන බැවින් 1962 නොවැම්බර් මාසයේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්ත මේන්තුවේ ග්‍රන්ථ විඥපන කාර්යාලය මගින් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ සම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ මංගල කලාපය 1962 නොවැම්බර් මස පළ වූ පොත්පත් ඇතුලත් කොට 1963 දී සිංහල බසින් ප්‍රකාශයට පත් කරන ලද අතර දෙසැම්බර් මස කලාපය සිංහල හා ඉංග්‍රීසි බසින් ප්‍රකාශයට පත් කරන ලදී. එතැන් පටන් 1972 වර්ෂය දක්වා නොකඩවා ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙම කාර්යය ඉටු කරන ලදී. 1970 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත සම්මත වීමෙන් අනතුරුව 1973 දී එම කාර්යය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පවරන ලදී. අභිනවයෙන් ආරම්භ කරන ලද මෙම ආයතනයේ සිදු වූ ප්‍රමාද දෝෂ හා විවිධ දුෂ්කරතා නිසා 1972 මැයි සිට දෙසැම්බර් දක්වා කලාපය ද 1973 හා 1974 වර්ෂවල කලාපයන් ද ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය. 1976 දක්වා ම ඒවා පළ කිරීමට නොහැකි වීමෙන් ඉබේම එය අතපසු වූ ප්‍රකාශන ගොඩට එකතු විය

**1972 මැයි සිට දෙසැම්බර් දක්වා කලාපය :**

ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ පූර්ව කාලීන ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය අරඹන ලද්දේ මෙම කලාපයෙනි. 1972 ජනවාරි සිට අප්‍රේල් දක්වා කලාපය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශයට පත් කොට ඇති අතර මැයි සිට දෙසැම්බර් දක්වා කලාපය සම්පාදනය කිරීමේ වගකීම ශ්‍රීලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරිනි. එය පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් සම්පාදනය කරන ලද්දේ ආරියරත්න සේනාධීර මහතා විසිනි. 1975 දී එහි සම්පාදන කටයුතු ආරම්භ කල අතර 1977 දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. අදාළ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ පළ වූ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර මෙහි ඇතුලත් කොට ඇත.

**1973 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කලාපය:**

1973 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ පළ වූ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පොත් මෙම කලාපයේ ඇතුලත් වේ. පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදන ක්‍රියාවලියේ දෙවැන්න

වශයෙන් සැලකිය හැකි මෙම කලාපය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් එන්. අමරසිංහ මහතා විසින් සම්පාදනය කරන ලදී. 1976 දී සම්පාදන කටයුතු ආරම්භ කළ අතර 1979 දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මෙය ප්‍රකාශයට පත් කොට ඇත.

**1974 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කලාපය :**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂවරයෙකුව සිටි ටී.ඩී.ඩී. ගුණසේකර මහතා විසින් 1981 මැද භාගයේ දී පමණ මෙහි සම්පාදන කටයුතු ආරම්භ කොට ඇති අතර පුස්තකාල සේවා මණ්ඩලය විසින් මෙය සමුච්චිත වෙළුමක් වශයෙන් 1984 දී පමණ ප්‍රකාශයට පත් කොට ඇත. ප්‍රකාශිත වර්ෂය හෝ දිනය නිශ්චිත වශයෙන් මෙම කාලාපයේ සඳහන් නොවේ. මෙම ලිපිය ලියන මොහොත වන විට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පූර්ණ දයකත්වයෙන් යුතුව ප්‍රකාශයට පත් කොට ඇති පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය මෙය වේ. 1974 වර්ෂවල ශ්‍රී ලංකාවේ පළ වූ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පොත් පිළිබඳ සාධිකාරි ලේඛනය මෙම ග්‍රන්ථ නාමාවලිය යි.

**1972, 1973 හා 1974 වර්ෂවල පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලින් සම්පාදනයේ දී මුහුණ දී ඇති දුෂ්කරතා සැකවින් :**

මෙම ග්‍රන්ථනාමාවලි සම්පාදනයේ දී ද එකල මුහුණ පා ඇති දුෂ්කරතා මොනවාදැ යි නිශ්චිත වශයෙන් ම සඳහන් කළ නොහැකි වුවත් අදාළ ලිපි ගොනු පරීක්ෂා කිරීමේ දී හෙළිවන තොරතුරු අනුව මෙම කාර්ය ඉටු කිරීම සඳහා පුස්තකාල සේවා මණ්ඩලය විශාල පරිශ්‍රමයක් දරා ඇති බව පැහැදිලි වේ. එහි දී දුෂ්කරතා රාශියකට ද මුහුණ දී ඇති බව ද පෙනේ.

එකල ග්‍රන්ථනාමාවලි කරණය පිළිබඳ පළපුරුදු ග්‍රන්ථ නාමාවලිකරුවන් මණ්ඩලයේ සේවය නොකළ බැවින් පිටස්තර ආයතනවල සේවය කරන ලද ග්‍රන්ථ නාමාවලි සම්පාදකයින්ගේ සේවය 1972 හා 1973 කලාප සම්පාදනය කිරීම සඳහා යොදා ගැනීමට සිදු වී ඇත. ඒ සඳහා ඔවුන්ට සෑහෙන මුදලක් ද ගෙවීමට සිදු වූ අතර මණ්ඩලය ඉලක්ක කරගත් දිනට ඒවා පළ කිරීමට ද නොහැකි වූ බව හෙළිවේ.

තව ද ග්‍රන්ථනාමාවලි සම්පාදනය කිරීමට අවශ්‍ය ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට යායුතු විය. සම්පාදකයින්ගේ සේවය නොකඩවා ලබා ගැනීමේ දී මෙය ද ගැටළුවක් විය. ලේඛනාගාරයේ නීතිරීති අනුව අදාළ කර්තව්‍යය කළ යුතු බැවින් තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා සම්පාදකයා හැර වරින් වර වෙනත් අය යෙදවීමට අසීරු වූ බව සඳහන් වේ. යතුරු ලියන කටයුතු වලදී ද තොරතුරු එක්රැස් කිරීමේදී ද විවිධ දුෂ්කරතා වලට මුහුණ පා ඇත. සිංහල, දෙමළ මෙන් ම ඉංග්‍රීසි යතුරු ලේඛකයින් ප්‍රමාණවත් තරම් එකල මණ්ඩලයේ සේවය නොකිරීම නිසාත් අර්ධකාලීනව එම සේවය ලබා ගැනීමට අපහසු වීමත් මෙහි දී බලපාන ලදී. එමෙන් ම දෙමළ පොත්වල තොරතුරු රැස් කිරීම හා යතුරු ලියනය සඳහා ග්‍රන්ථනාමාවලී කටයුතු දන්නා දෙමළ නිලධාරීන් යෙදවීම ද එකල ප්‍රශ්නයක් වී ඇත. බොහෝ අවස්ථාවලදී අර්ධකාලීන සේවයේ යම් යම් අය යොදවා එම කාර්යයන් ඉටු කරගෙන ඇත.

ග්‍රන්ථනාමාවලි මුද්‍රණය ද මෙකල ප්‍රශ්නයක් වූ බව වාර්තා වේ. 1972 හා 1973 කලාප සංස්කරණය කිරීමෙන් අනතුරුව අත්පිටපත රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට භාරදීමෙන් අනතුරුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් මුද්‍රණය කොට ඇත.

ඉහත සඳහන් කළ නොකළ දුෂ්කරතා හා ආයතනික ප්‍රශ්න පැන නැගී ඇති බැවින් යට කී 1972, 1973 හා 1974 පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලින් ප්‍රකාශ කිරීමට එක් කලාපයක් සඳහා වර්ෂ 2–3 අතර කාලයක් මිඩංගු කිරීමට සිදු වී ඇති බව පෙනේ.

**වත්මන් ව්‍යාපෘතිය (1962—1885):.**

ලිපිගොනු වලින් හෙළිවන පරිදි 1962 පූර්වකාලීන ග්‍රන්ථනාමාවලිය සම්පාදන කටයුතු ආරම්භ කොට ඇත්තේ 1981 වර්ෂයේදී ය. 1981 සිට 1986 දක්වා අවුරුදු 5ක පමණ දීර්ඝ කාලයක් නොයෙකුත් බාධක හා දුෂ්කරතා මැද මෙය පලකිරීමට මණ්ඩලය උත්සාහ කළ ද එම තැත ව්‍යර්ථ වී ඇත.

එහෙත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීමත් සමඟ 1990 අප්‍රේල් මාසයේ දී විශාල ව්‍යාපෘතියක් වශයෙන් වත්මන් ව්‍යාපෘතිය (1962 – 1885) ආරම්භ කරන ලදී. එහි මුල් පියවරක් වශයෙන් 1962 පූර්වකාලීන ග්‍රන්ථනාමාවලියේ සම්පාදන කටයුතු දැන් නිමවෙමින් පවතී.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම, සාක් ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය හා නොයෙකුත් ආයතනික හේතු නිසා 1962 හි පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය සැලසුම් කරගත් දිනට ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 1992 වර්ෂය තුළ එය ප්‍රකාශයට පත් කිරීමට හැකිවෙයැයි විශ්වාස කෙරේ.

**1962 පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනයේ දී මුහුණ පාන දුෂ්කරතා :**

1962 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත්පත් සහ ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත එවනු ලැබූ මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත (179 පරිච්ඡේදය) යටතේ ලියාපදිංචි කරන ලද පොත්පත් ආශ්‍රයෙන් මෙම පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය

සම්පාදනය කෙරෙන අතර එහි නොමැති පොත්වල විස්තර පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් හෝ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙන් ලබා ගනු ලැබේ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව චිප්බෝඩ් (Chip Board) යොදා මේ සඳහා ම විශේෂයෙන් සකස් කල පෙට්ටිවල මෙම පොත් සුරක්ෂිතව අසුරා ඇත. පෙට්ටියක බහාලන පොත් ප්‍රමාණය තීරණය වන්නේ පොත්වල විශාලත්වය අනුවය.

දෛනිකව පිරිසිදු කිරීම් කළ ද ස්වභාවයෙන්ම තැන්පතුවට එකතුවන දූවිලිත් තැන්පත් පිටපත් බොහොමයක් බාල වර්ගයේ කඩදාසිවල මුද්‍රණය කොට තිබීම හා එම පොත් නිෂ්පාදනයේ දී යොද ගන්නා ලද රසායනික සංයෝගයනුත් හේතු කොට ගෙන ලේඛනවල දිරායාමක් සිදුවන අතර එමගින් කිසියම් දූවිලි ස්වභාවයක් හටගෙන ඇති නිසාත්, විවිධ කෘමීන් මෙම පොත් වලට හානි පමුණුවන නිසාත්, නීතිමය තැන්පතුව වේගයෙන් වැඩෙන නිසාත්, වර්තමාන ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ බලධාරීන් නීතිමය තැන්පතුව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මහත් අභියෝගයකට මුහුණ දී ඇත. නමුත් එවැනි උපවද වලින් නීතිමය තැන්පතුව ආරක්ෂා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව සෑම උත්සාහයක් ම දරන බව පෙනේ.

කෘමීන්ගෙන් පොත් ආරක්ෂාකර ගැනීම සඳහා යොදන ලද රසායන ද්‍රව්‍ය හා ඉහත සඳහන් කළ පරිදි ඇතිවන රසායන ද්‍රව්‍ය මිශ්‍ර වූ දූවිලි ආශ්වාස කරමින් දිනපතා මෙම පොත් ආශ්‍රයෙන් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු රැස් කරන ග්‍රන්ථනාමාවලී සම්පාදකයාගේ කාර්යය බෙහෙවින් දුෂ්කර ය. අවුරුදු ගණනාවක් එක දිගට මෙම කාර්යයේ යෙදෙන අයෙකුට කල් පවතින රෝග වැළදීමට ඉඩ ඇත.

නීතිමය තැන්පතුවේ ආරක්ෂාව සඳහා ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පනවා ඇති කාලෝචිත නීතිරීති නිසි ලෙස පිළිපදිමින් මෙම කාර්ය කළ යුතුව ඇත. එක්වර පොත් පෙට්ටි දෙකක් පමණක් ලබා ගෙන එහි කටයුතු අවසන් කොට අනෙක් පෙට්ටි දෙක ලබා ගත යුතු ය. මෙහි දී අප ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේම කම්කරුවෙකුගේ සහාය ලබා ගත යුතුය. අපගේ කම්කරුවන් යොදා ගැනීමට ඉඩකඩ නොලැබෙන්නේ නීතිමය තැන්පතුව ඇති ස්ථානයට පිටස්තර කිසිම කෙනෙකුට ඇතුළුවීමට අවසර දී නොමැති නිසා ය.

මෙම කාර්ය ඉටු කිරීමේ දී සම්පාදකයාට ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සිය ශක්ති ප්‍රමාණයෙන් පහසුකම් සලසා දුන් බව ස්තුති පූර්වකව සඳහන් කරමි. රාජ්‍ය ලේඛනාගාරයේ දී මෙම කාර්යයෙහි නිරතවූ අයෙකුට කෑම ගැනීම හා තේ පානය සඳහාවත් නියමිත වෙලාවට පිටවීම අපහසු ය. රසායන ද්‍රව්‍ය මිශ්‍රිත දූවිලි අතපත ගෑම හා තමා ලබා ගත් පෙට්ටිවල අඩංගු පොත්වල ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම මෙහි දී හේතු වශයෙන් දැක්විය හැකි ය. මෙවැනි ප්‍රායෝගික කරුණු රාශියක් සැලකිල්ලට ගනිමින් මෙය ඉටු කළ යුතු බැවින් සම්පාදක ඉටු කරනුයේ දුෂ්කර කාර්යයක් බව සඳහන් කරනු කැමැත්තෙමි.

ඉහත සඳහන් කරන ලද අයුරින් එකතු කර ගන්නා ලද තොරතුරු සුචිපත් වල යතුරු ලියනය කරනු ලබන්නේ පුස්තකාල විද්‍යාව හෝ ග්‍රන්ථනාමාවලී කරණය පිළිබඳ කිසිදු දැනුමක් නොමැති තාවකාලික පුහුණුවන යතුරු ලේඛක ලේඛිකාවක් විසිනි. ඔවුන්ට මේ පිළිබඳ අවබෝධයක් නැති කමින් යතුරු ලියනය කරන ලද කාඩ්පත් දෙතුන් වතාවක් නිවැරදි කිරීමට සිදු විය. අත්පිටපත ටයිප් කිරීමේ දී ද ඒ තත්ත්වයට මුහුණ දීමට සිදු විය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් අභිනවයෙන් ආරම්භ කරන ලද මෙම විශාල ව්‍යාපෘතිය ඉතා වැදගත් එකක් බව කවුරුත් පිළිගනී. මෙය විශාල ව්‍යාපෘතියක් බැවින් එක් අයෙකුට තනිවම පූර්ණකාලීනව කිරීමට දීර්ඝ කාලයක් ගතවීම නොවැලැක්විය හැකි ය. වත්මන් ලෝකයේ බොහෝ රටවල මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර එම ව්‍යාපෘතිය භාරව වග කිවයුතු නිලධාරියෙක් සිටින අතර සහායට කීප දෙනෙකු ම යොද ගෙන ඇත.

උදාහරණයක් වශයෙන් නෙදර්ලන්තයේ පොත් පිළිබඳ පූර්ණකාලීන ජාතික ග්‍රන්ථනාමාවලි ව්‍යාපෘතියේ දිගුකාලීන උප ව්‍යාපෘතියක් වශයෙන් සැලකෙන කෙටි ග්‍රන්ථනාම සුචිය (1540–1800) පිළිබඳ ව්‍යාපෘතිය සැලකිල්ලට ගත හැකි ය. (STCN - Short term catalogue, Netherland) එහි කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. **ග්‍රන්ථනාමාවලිකරුවන් 01**
2. **සූචි සකස් කරන්නන් 02**
3. **දක්ෂ යතුරු ලේඛකයින් 01**

පොත් ලක්ෂ තුනක් පමණ අඩංගු මෙම ව්‍යාපෘතිය අවුරුදු 25–30 ක පමණ දිගුකාලීන ව්‍යාපෘතියකි.

තව ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් සම්පාදනය කරන ප්‍රවර්තන ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය කිරීම සඳහා අවම වශයෙන් 4 දෙනෙකුගේ සහාය ලබා ගන්නා බැවින් පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සඳහා සම්පාදකවරයාට සහාය වීමට පුස්තකාල විද්‍යාව හදාරා ඇති ඉංග්‍රීසි, සිංහල යතුරු ලියනය දන්නා එක් සහායකවරයෙකු හා දෙමළ අංශය සඳහා ද එවැනි ම සහායකයකු යොදා ගතහොත් එය ද වර්ෂයකට එකක් බැගින් ක්ෂණිකව ප්‍රකාශ කළ හැකි වේ. 1962 සිට 1885 තෙක් දිවෙන වර්ෂ 77ක් ආවරණය වන පරිදි වාර්ෂිකව පියවරෙන් පියවර සම්පාදනය කිරීමට සැලසුම් කොට තිබුණු මෙම පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය පිළිබඳ ව්‍යාපෘතියේ පළමු පියවර 1962 වර්ෂයට අදාලව සම්පාදනය

කොට 1961, 1960 ආදී වශයෙන් අතීතයට යාමට කලින් තීරණය කළ ද මෙතෙක් අප ලද අත්දැකීම් අනුව ඊලඟ පියවර වශයෙන් 1885 ජාතික ග්‍රන්ථනාමාවලියෙන් පටන් ගෙන 1886, 87 ආදී වශයෙන් ඉදිරියට ඒමට මණ්ඩලයේ අවධානය යොමු වී ඇත.

නැවත මුද්‍රණ ඉවත් කිරීම, වාර්ෂික මුදල් ප්‍රතිපාදන මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ පනත 1885 බිහිවීම හා එතැන් සිට නීතිමය තැන්පතු නීතිය ක්‍රියාත්මක කිරීම සහ ක්‍රමානුකූල විකාශනය යන කරුණු පිළිබඳ සැලකිල්ලට ගෙන මණ්ඩලය මේ සඳහා අවධානය යොමු කොට ඇත. ඒ අනුව මෙම මහා ව්‍යාපෘතියේ දෙවන පියවර වශයෙන් 1885 වර්ෂයට අදාළ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ සම්පාදන කටයුතු 1992 වර්ෂය තුළ ආරම්භ කිරීමට බොහෝ දුරට ඉඩ ඇති බව සඳහන් කළ හැකි ය.

1962 පූර්වකාලීන ග්‍රන්ථනාමාවලියට පමණක් නොව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලී වැඩ පිළිවෙලට ම පොදුවේ බලපාන ගැටළු කීපයක් දක්නට ලැබේ. 1885 තැන්පතු නීතිය යටතේ රට තුළ පලවන සියළුම ප්‍රකාශන රාජ්‍ය ලේඛනාගාරයට නොලැබේ. සමහර මුද්‍රණ කරුවන්ට මෙම නීතිය පිළිබඳව අවබෝධයක් නැතිකම ද, කොළඹින් බැහැර ඇත. පිටිසර ප්‍රදේශවල මුද්‍රණ කරුවන් මේ පිළි බඳව සැලකිලිමත් නොවීම ද, ඉතා වටිනා පොත් වලින් පිටපත් පහක් වැනි ප්‍රමාණයක් නොමිලේ සැපයීමට ප්‍රකාශකයින් සහ කර්තෘවරයන් අකමැතිවීම ද දීප ව්‍යාප්ත වැඩ පිළිවෙලක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ද දැඩි අවශ්‍යතාවයක් තිබුනද පවතින ප්‍රායෝගික දුෂ්කරතා ආදී කරුණු නිසා රට තුළ පලවන සියළුම ප්‍රකාශන වල පිටපත් රාජ්‍ය ලේඛනාගාරයට ලබා ගැනීමට අපහසු වී ඇත. ජාතික හා ඓතිහාසික වැදගත්කමක් ඇති කටයුත්තක් වශයෙන් මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට වැඩ පිළිවෙලක් සකස් කළ හැකි නම් මේ කාර්යය මීට වඩා ඵලදායි අයුරින් ඉටු කළ හැකි ය.

ජාතික ලේඛනාගාරය කීපවරක් තැනින් තැනට මාරු කිරීමෙන් පොත් රාශියක් අස්ථානගත වී ඇත. ඒ නිසා ද පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය සර්ව සම්පූර්ණ එකක් යැයි සඳහන් කළ නොහැකි ය.

ලන්දේසි පාලන සමයට අයත් 1640 වර්ෂයේ දී ගාල්ලේ ආරම්භ කරන ලද ජාතික ලේඛනාගාරය 1656 දී වර්තමාන නිදහස් චතුරශ්‍රය ඉදිකොට ඇති ස්ථානයේ පිහිටුවා තිබූ ලන්දේසි ලේකම් කාර්යාලයටත්, 1796 දී යටත් විජිත භාර මහ ලේකම්ගේ කාර්යාලයටත්, 1931 දී කොළඹ කොටුවේ පිහිටි පැරණි ලේකම් කාර්යාලයටත් ගෙන යන ලදී. අනතුරුව ලේඛනවල ආරක්ෂාව තහවුරු කිරීම පිණිස නුවර එළියට ගෙන යන ලදී. පසුව 1962 දී නැවත ගංගොඩවිල විද්‍යෝදය විශ්ව විද්‍යාලයට මාරු කරන ලද අතර 1970 දී වර්තමාන රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටි රීඩ් මාවත, කොළඹ 07 යන ස්ථානයට ගෙන එන ලදී.

ඉහත සඳහන් කළ පරිදි දුෂ්කරතා රාශියකට මුහුණ දෙමින් සම්පාදනය කෙරෙමින් පවතින 1962 වර්ෂයේ පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලිය පුස්තකාල සේවා මණ්ඩලය ඉලක්ක කර ගත් දිනට ප්‍රකාශ කිරීමට නොහැකි වූ බව සඳහන් කරන අතර එය 1992 වර්ෂය අවසන් වීමට පෙර ප්‍රකාශයට පත් කිරීමට සියළු විධි විධාන යොදා ඇති බව සඳහන් කළ හැකි ය. තව ද 1962–1885 අතර වර්ෂ 77ක් ආවරණය වන පරිදි ආරම්භ කොට ඇති මෙම මහා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය හැකි සෑම උත්සාහයක් ම දරන බව සඳහන් කරන්නේ ප්‍රීතියෙනි.

**ආශ්‍රිත ලිපි හා ග්‍රන්ථ**


01. ගුණසේකර, ධනපාල. 1982. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය, පුස්තකාල ප්‍රවෘත්ති, අප්‍රේල්/ජූනි, පි. 9 — 11

02. විමලරත්න, කේ. ඩී. ජී. 1991. ලංකාවේ නීතිමය තැන්පතු නීතිය හා එහිදී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, ශ්‍රී. ලං. ජා. පු. සේ. ම. සාක්ෂ සම්මන්ත්‍රණ මාලා අංක 04 (1991. 11. 07)

03. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය / ලිපි ගොනුව — ජාග්‍රනා/2/3/10

04. Archives: The memory of a nation (1986) Pg. vii.

05. GUNATILAKA, H. A. I., A Bibliography of Ceylon.

06. HARROD, L. M. – Librarians Glossary.

07. JEAN, LUNN. Guidelines for legal Deposit Legislation. UNESCO PGI – 81/ws/28. Pg. 1.

08. WILLEMSEN, A. W. 1990. Retrospctive National Bibliography : Operational projects and Possible Future Developments in the Netherlands IFLA Journal, 16 (1), PP. 97–104.

# நூலக நடவடிக்கைகளில் கணனியினது தாக்கமும் பாவனையும்

எம். பீ. எம். பைரூஸ்
பிரதம நூலகர்
தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களம்

**அறிமுகம்**

கணனி மிகவும் குறுகிய காலத்தில் சமுகத்தில் சகல மட்டங்களிலுமுள்ள மக்களது வாழ்க்கையில் அதிகளவு தாக்கத்தினை ஏற்படுத்தி உள்ளது. இன்று பழம் பெரும் விஞ்ஞானிகள் முதற்கொண்டு சிறு பிள்ளைகள் வரை வயது, அறிவுமட்ட வேறுபாடுகளின்றி தத்தமது தேவைகளுக்காக கணனியைப் பயன்படுத்துகின்றார்கள்.

கணனியின் புது புதுக்கண்டு பிடிப்புகள் மிகவும் வேகமாக உலகின் பல்வேறு நாடுகளிலும் மக்களது பாவனைக்கு உட்படுவதே இன்று கணனியின் துரித முன்னேற்றத்திற்கும், அதிகளவு தாக்கத்திற்கும் காரணமாக அமைந்துள்ளது எனலாம். உதாரணமாக தொலைக்காட்சித் தொழில் நுட்பத்தை எடுத்துக்கொண்டால் அது இலங்கையில் அறிமுகப்படுத்தப்பட்டது கண்டு பிடிக்கப்பட்டும் ஐம்பது ஆண்டுகளுக்கும் பின்னரேதான் என்பது குறிப்பிடத்தக்கது. எனினும் கணனித் தொழில் நுட்பமானது அது கண்டுபிடிக்கப்பட்ட ஒரு சில வருடங்களிலேயே இலங்கையிலும் பெற்றுப் பயன்படுத்தும் வாய்ப்பு பெரிதும் உருவாகியுள்ளது எனலாம்.


மேலும் வர்த்தகம், கைத்தொழில், கல்வி முதலிய பல்வேறு துறைகளிலும் கணனி அதிகளவு தாக்கத்தினை ஏற்படுத்தியுள்ளது. அத்துடன் போக்குவரத்து, வங்கி அலுவல்கள், பொழுதுபோக்கு போன்ற துறைகளிலும் அது ஏற்படுத்தியுள்ள தாக்கமானது ஈண்டு குறிப்பிடக் கூடியது. எந்தவொரு நடவடிக்கையினையும் மனித வலுவினால் செய்வதனைவிடக்கணனியைப் பயன்படுத்திச் செய்யுமிடத்து மிகவும் துரிதமாகவும், நேர்த்தியாகவும் செய்ய முடிகின்றமையே இதற்கு முக்கியமான காரணமாகும். இதனாலேயே உலகின் அபிவிருத்தியடைந்த நாடுகளுக்குப் புறம்பாக மூன்றாவது மண்டல நாடுகளிற்கூட பல்வேறு துறைகளிலும் கணனியின் செல்வாக்கினை ஓரளவாவது காணக்கூடியதாக இருக்கின்றது.

கணனி விஞ்ஞானிக்கு விஞ்ஞான ஆய்வுகளை மேற்கொள்ளவும், பரிசோதனைகளை நடாத்தவும், ஆகாய விமானங்கள், விண்வெளிச் சாதனங்களை கொண்டு நடாத்தவும், வங்கியாளர்களுக்கு பணம் சம்பந்தமான கடமைகளை மேற்கொள்ளவும், விமானப் பயனிகளுக்கு உலகம்பூராவுமுள்ள விமானப் பிரவேசச் சீட்டுக்கான ஆசனங்களை முன்கூட்டியே பதிவு செய்து கொள்ளவும், வைத்தியர்களுக்கு நோயாளியினது நோய், உடல் சம்பந்தப்பட்ட நிலைமைகளை அறிந்து கொள்ளவும், பொழுதுபோக்குனர்களுக்கு வீடியோ விளையாட்டுக்களை விளையாடவும் உபயோகிக்கப்படுகின்றது.


மேலும் வெவ்வேறு துறைகளிலும் கணனி ஏற்படுத்தியிருக்கும் தாக்கமானது அத்தொழிலின் தன்மைகளை முற்றாக மாற்றமடையச் செய்திருப்பதோடல்லாது, புதிய கடமைகளையும் அறிமுகம் செய்துள்ளது. அத்துடன் அத்தொழிற்றுறையை விரிவாக்கியுமுள்ளது எனலாம். இதற்குச் சான்றாக நூலகவியற்றொழிற்றுறையில் கணனியின் உட்புகுதல் அத்தொழிற்றுறையை 'நூலக தகவல் விஞ்ஞானமாக' அறிமுகம் செய்துள்ளது. நூலகவியற் செயற்பாடுகள் இன்று கணனியின் உதவி கொண்டே செயற்படுத்தப்பட்டுவருகின்றது. இன்று தகவல் விஞ்ஞானமும் இத்துறையுடன் இணைந்தமையினால் நவீன நூலக அலுவலர்களாக கணனியுடன் சம்பந்தப்பட்ட தொழிற்றுறையைச் சார்ந்தவர்களும் அமைவது குறிப்பிடத்தக்கது.

நூலகங்களிலுள்ள சகலவிதமான ஆவணங்களிலும் அடங்கியுள்ள தகவல்களை குறுகிய நேரத்தில் குறிப்பிட்ட வாசகருக்கு எடுத்துக் காட்டுவதற்கு நூலகங்களில் மரபுரீதியாகப்பயன்படுத்தப்பட்டு வந்த பராமரிப்பு முறைகள் எதிர்பார்க்கும் பயன்பாட்டினை வழங்குவதில்லை என்பதனை நூலகர்களும், தகவல் விஞ்ஞானிகளும் நன்குணர்ந்துள்ளனர். எனவேதான் மரபுவழியான இச்செயற்பாடுகளுக்கு மாற்றீடாக நவீன முறையினை அறிமுகம் செய்ய வேண்டி நின்ற காலகட்டத்திலேயே ஏனைய அனைத்து பல்வேறு துறைகளிலும் கணனியின் தாக்கமானது மேலோங்கி நிற்பதனை அவர்கள் உணர்ந்தனர். இதன்காரணமாக நூலக செயற்பாடுகளைச் செவ்வனே கொண்டு நடாத்துவதற்கு கணனியை பயன்படுத்த விழைந்தனர். குறிப்பிட்ட காலத்திற்குள் நூலகத்துறையில் பாரிய மாற்றங்களை கணனி அறிமுகம் செய்துள்ளமையை அவதானிக்கக் கூடியதாக உள்ளது.

பலதுறையினராலும் பல்வேறு நடவடிக்கைகளுக்கும் பயன்படுத்தப்பட்டு வருகின்ற கணனிவகைகளில் மினி கொம்பியூட்டர் (Mini Computer) மைக்ரோ கொம்பியூட்டார் (Micro Computer) ஆகிய இருவகைக் கணனிகளுமே நூலக நடவடிக்கைகளை கணனி மயப்படுத்துவதற்கு பெரிதும் உபயோகப்படுத்தப்படுகின்றன.



பொதுவாக்க கணனியை அதன் அமைப்பினைக் கொண்டு. இரு பெரும் பிரிவுகளாக வகுக்கலாம். கணனியின் மின் இயக்க இயந்திரப்பகுதியினை (Hardware) என்றும், கணனிக்கு அறிவுறுத்துவதற்கு பயன்படுத்தப்படுகின்ற செயற்றிட்டங்களும், அதனோடு இணைந்த ஆவணவாக்கமும் அடங்கிய பகுதியினை ' Soft ware ' என்றும் வழங்குவர் மேலும் கணனியொன்றினது அமைப்பு முறையிலுள்ள அடிப்படை உறுப்புக்களை பின்வரும் விளக்கக் குறிப்பின் மூலம் அறியலாம்.




கணனியின் அடிப்படை உறுப்புக்களான கட்டுப்பாட்டு அலகு, நினைவலகு அல்லது சேமிப்பு அலகு, உள்ளீட்டு அலகு, வெளியீட்டு அலகு, மத்திய செயற்பாட்டு அலகு, எண்கணித தர்க்க அலகு என்பனவாகும், இவற்றில் மத்திய செயற்பாட்டு அலகில் (Central Processing Unit) கட்டுப்பாட்டு. அலகு, நினைவலகு, எண்கணித தர்க்க அலகு ஆகிய உள்ளடக்கப்பட்டு அமைக்கப்பட்டுள்ளன, இதனை 'Cpu' என சுருக்கமாக அழைப்பதும் உண்டு.

## கணனிமொழி ( Computer Language )

கணனிக்கு ஒரு விடயத்தை அறிவுறுத்துவதற்கெனவும், ஊட்டுவதற்கெனவும் என தனிமொழியுண்டு. கணனி இம்மொழியினை புரிந்து செயற்படக்கூடிய தன்மையில் அமைக்கப்பட்டுள்ளது. இம்மொழியானது மனித மொழியினை ஒத்ததும் எளிமையானதுமாகும். எனவே இம்மொழியினை உயர்நிலை மொழியென அழைக்கப்படுகின்றது.

உயர்நிலை மொழிகள் தனிப்பட்ட ஒரு கணனிக்கென எழுதப்படுவதில்லை. பொதுவாக ஒரு உயர்நிலை மொழியினை அனைத்துவகையான கணனியிலும் பயன்படுத்தலாம், Basic, Cobal, Fortran போன்றன உயர்நிலை மொழிக்கு உதாரணங்களாகும். இவை கணனி மொழிகளாகும்.

கணனிக்கான செயற்றிட்டங்களை தயாரிப்பதற்கு உயர்நிலை மொழிகள் அவசியப்படுகின்றன. கணனி செயல்திட்டங்களை எவ்வகை இனத்தைச் சார்ந்த கணனிகளிலும் பயன்படுத்தலாம், மேலும் உயர்நிலை மொழியினைப்பயன்படுத்தி கணனிக்கு ஊட்டுவதற்கான செயல்திட்டத்தை தயாரிப்பதற்கு போதியளவு பயிற்சிபெற்ற செயல் திட்ட வரைவாளர்களின் உதவி அவசியமாகும். கணனிப்பாவனையாளர்களுக்கு தற்போது ஏற்கனவே தயாரிக்கப்பட்ட செயல்திட்டங்களையும், அவற்றிற்கான அறிவுறுத்துதல்களையும் கொள்வனவு செய்து பயன்படுத்தக்கூடிய வாய்ப்பு கிடைக்கப்பெற்றிருப்பது நூலக நடவடிக்கைகளை செவ்வனே மேற்கொள்ள மிகவும் வசதியாக உள்ளது.

## கணனியும் நூலகங்களும்

இன்று விஞ்ஞான தொழில்நுட்பத்துறைகளில் வளர்ச்சி, அச்சுயந்திரத்தின் அறிமுகம் முதலியவற்றினாற் பெருமளவு வெளியீடுகள் அச்சிடப்பட்டுத் தொடர்ச்சியாக வெளிவந்த வண்ணமாகவே உள்ளன. இவ்வெளியீடுகள் நூல்கள், சஞ்சிகைகள், அறிக்கைகள், ஆய்வேடுகள் என பல்வேறு வடிவத்தினவாக வாசகரை அடைகின்றது. இவைகளுக்கு புறம்பாக பல்வேறுவகையான நுண்வடிவங்கள், ஒலிப்பதிவு நாடாக்கள், அசையும் வடிவங்கள் போன்றவைகளுக்காகவே தனியான பகுதிகள் நவீன நூலகங்களில் ஒதுக்கப்பட்டு இருப்பதைக் காணலாம். இன்றைய நவீன நூலகங்களில் இவைகளை மாத்திரம் கொண்டதாக 'கட்புல-செவிப்புல சாதனப்பகுதி' (Audio - Visual Division) இயங்கி வருவதைக் காணக்கூடியதாக உள்ளது. அத்தோடு கட்புல - செவிப்புல சாதனங்கள் நூலகங்களில் முக்கிய இடத்தினை வகிக்கின்றமையையும் அவதானிக்கலாம்.

நாளுக்குநாள் பெருகிவரும் அச்சிடப்பட்ட வெளியீடுகள், கட்புல - செவிப்புல சாதனங்களை வாசகருக்கு குறுகிய நேரத்தில் உரிய தகவல்களை வழங்கவும், ஆவணங்களை சேகரித்து, ஒழுங்குபடுத்தி, சேவைப்படுத்தும் பணியினை செவ்வனே செய்யவும் நூலகங்களும், தகவல் நிலையங்களும் மரபுரீதியாக பயன் படுத்தப்பட்டு வந்த பராமரிப்பு முறைகளுக்கு பதிலாக கணனியைப் பயன்படுத்த விழைகின்றது. ஏனெனில் மனிதவலுவைக்கொண்டு செய்வதனைவிட கணனியின் உதவியுடன் மிகவும் விரைவாகவும், திட்டமிட்டபடி பிழையின்றியும் நூலக நடவடிக்கைகளை செம்மைப்படுத்தலாம். எனவேதான் நூலகர்களும் நூலக நடவடிக்கைகளை கணனிமயப்படுத்துவதற்கு விரும்புகின்றனர், நூலகங்களுக்கு நூல்கள், பருவ இதழ்கள் முதலிய நூலக ஆவணங்களைச் சேகரித்து ஒழுங்குபடுத்துவதன் முக்கிய நோக்கமே வாசகர்களுக்கு திறம்பட்ட சேவையினை வழங்குவதாகும். இன்று மரபுரீதியான சேவைகளை வழங்கி வருகின்ற நூலகங்களிற்கூட வாசகர்கள் தகவற்சேவையினை எதிர்பார்க்கின்ற நிலைமையை அவதானிக்கலாம். இவ்வாறான தன்மையே நூலகங்களும், தகவல் நிலையங்களும் கணனிமயப் படுத்தப்படவேண்டிய நிலைமையை உணர்த்துவதாக உள்ளது.

## நூலக நடவடிக்கைகளில் கணணியினது அறிமுகம் நூலீட்டற் செயற்பாடு

நூலகமொன்றினது திறம்பட்ட சேவைக்கு நூலகத்தினது சேகரிப்பே ( Library Collection ) மிகவும் முக்கியமானது. இவ்வகையில் நூலகமொன்றினது சகலவிதமான ஆவணங்களும் முக்கிய பங்காற்றுகின்றன. நூலீட்டற் செயற்பாடு நூலகரது அனுபவத்திலும், திறமையிலுமே தங்கியுள்ளது. பொதுவாக நூலீட்டற்செயற்பாடு என்பது நூலக இருப்பை பராமரித்தலில் அடங்குகின்றன.

வாசகரது தரம், அவர்களது தேவை, நூலகத்தின் நிதி நிலைமை முதலிய அம்சங்களைக் கருத்திற்கொண்டு தரமிக்க வெளியீடுகளை கொள்வனவு செய்வது நூலகரது கடமையாகும். வெளியீடுகளை கொள்வனவு செய்வதற்கு முன்பதாக கொள்வனவிற்கான நூல்கள்பற்றிய விபரங்களைச் சேகரித்தல் மிகவும் முக்கியமானது. இதனை மனிதவலுமூலம் செயற்படுத்தும் போது போதியளவு நேரமும், பல்வேறுவகையான கோவைகள் (Input) பராமரிக்க வேண்டியவர்களாக இருக்கிறோம். எனவே கணனியைப் பயன்படுத்தி நூல்விபரம் சேகரித்தல், ஆணைகள் தயாரித்தல், நிதிசெலுத்தல் போன்ற செயற்பாடுகளை இலகுவாக குறைந்த நேரத்தில் செய்யலாம். நூலகர் நூலீட்டற் செயற்பாட்டினை வேண்டிய தகவல்களைச் சரியான முறையில் கணனிக்கு உள்ளீடு (Input) செய்து, அறிவுறுத்தல்களை வழங்குமிடத்து தாமதமின்றி ஒழுங்காகவும், நேர்த்தியாகவும் செய்துகொள்ள வாய்ப்பேற்படுகின்றது.

### பருவ இதழ்க் கட்டுப்பாடு

நூலகங்களின் சேகரிப்பில் பருவ இதழ்கள் முக்கியமான இடத்தினை வகிக்கின்றது. ஆராய்ச்சியாளர்களின் முடிபுகள் நூல்வடிவில் வெளிவருவதற்கு முன்னர், பருவ இதழ்களில் இடம்பெற்று வாசகர்களுக்கு கிடைந்துவிடுகின்றது, பொதுவாக பருவ இதழ்கள் அண்மித்த தகவல்களை வாசகர்களுக்கு வழங்கும் ஒரு வகையான சாதனமாகும். குறிப்பாக ஆராய்ச்சி நூலகங்கள், விசேட நூலகங்கள், பல்கலைக்கழக நூலகங்களில் பருவ இதழ்களே முக்கிய இடத்தினைப் பெறுகின்றது.

பருவ இதழ்க்கட்டுப்பாடு சம்பந்தமான முக்கிய நடவடிக்கையாக பருவ இதழ்ப்பட்டியை தயாரித்தல், முகவருடன் தொடர்புகொள்ளுதல், நிதிசெலுத்துதல், பருவ இதழ்களைப் பதிவுசெய்தல், நூலகத்திற்கு கிடைக்காத பிரதிகளுக்கு நினைவூட்டற் கடிதம் அனுப்புதல், அடுத்த ஆண்டிற்கான நிதியினை கணக்கிடுதல் போன்ற நடவடிக்கைகளை கணனிமயப்படுத்திச் செய்யுமிடத்து, கணனிக்கு ஊட்டப்பட்ட பருவ இதழ்களின் விபரத்தினைக்கொண்டு பல்வேறுவகையான புதிய செயல்களையும் இலகுவில் செய்து கொள்ளலாம்.

பருவ இதழ்களுக்கான விபரங்களை கணனிக்கு உள்ளீடு செய்யுமிடத்து, வேண்டிய அறிவுறுத்துதல்களை வழங்குவதன் மூலம் குறுகிய நேரத்தில் பருவ இதழ்களுக்கான பட்டியினை அகரவரிசை ஒழுங்கிலோ, விடயவாரியாகவோ பெற்றுக் கொள்ள முடிகின்றது. கணனிமூலம் சேமிக்கப்பட்ட விபரங்களை காலத்திற்குக்காலம் அவசியமற்றவைகளை நீக்கவும், புதிதாக கொள்வனவு செய்த பருவ வெளியீடு ஒன்றினை உரிய இடத்தில் சேர்க்கவும் அவசியமான மாற்றங்களை தேவைக்கு தக்கவாறு செய்துகொள்ளவும் கணனி மிகவும் பயன்பாடுமிக்கதாக உள்ளது.

### பகுப்பாக்கமும் பட்டியலாக்கமும்

விஞ்ஞான தொழில் நுட்பவளர்ச்சியின் காரணமாக நாளுக்கு நாள் பெருமளவு வெளியீடுகள் வெளிவந்தபடி இருப்பதனால் நூலக ஆவணங்களை பகுப்பாக்கம், பட்டியலாக்கம் செய்வதில் ஏற்பட்ட தாமதம், வாசகருக்கு தகவல்களை வழங்குவதில் உள்ள நெருக்கடி என்பன போன்ற காரணங்களினால் மரபுரீதியான பட்டியலாக்க முறைகளை கணனிமயப்படுத்துவதுகொண்டு நிவர்த்திக்க நூலகர்கள் முனைந்தனர். இவர்களுக்கு ஆங்கிலோ - அமெரிக்கப் பட்டியலாக்க விதிமுறைகளின் இரண்டாம் பதிப்பு நூலகச் சேகரிப்புக்கு கிடைக்கப்பெறும் சகலவிதமான ஆவணங்களையும் பட்டியலாக்கம் செய்யப் பயன்படுத்துவதற்கேற்ற விதிமுறைகளைக் கொண்டதாகவும் கணனியிற் பயன்படுத்தக்கூடியவையான விசேடகுறியீடுகளைக் கொண்டதாகவும் வெளிவந்துள்ளது. அத்துடன் சர்வதேச தசாம்ச பகுப்பாக்கத்திட்டம் ( Universal Decimal Classification ), தூயி தசாம்ச பகுப்பாக்கத்திட்டம் (Dewey Decimal Classification) ஆகிய இரண்டு பகுப்பாக்கத் திட்டங்களும் மிகவும் நுணுக்கமான விடயங்களுக்குக்கூட வகுப்பு எண்களை உருவாக்க இடமளிக்கும் வகையில் திருத்தப்பட்டு பதிப்பிக்கப்பட்டுள்ளமை கவனிக்கத்தக்கது.

மேலும் சர்வதேச ரீதியிற் பட்டியலாக்கத்தில் ஒற்றுமைத்தன்மை பேணப்படுவதற்காக இயந்திர மூலம் வாசிக்கக்கூடிய பட்டியல் பதிவுகளை (Marc) முன்மாதிரியாகக் கொண்டு கணனிமயமான பட்டியல்பதிவுகளை உருவாக்கி நூலகங்கள் பயன்படுத்தி வருகின்றன. பட்டியலாக்கப்பதிவுகள் சர்வதேச தராதர நூல் விவரத்தினை அடிப்படையாகக்கொண்டு காங்கிரஸ் நூலகத்தினால் உருவாக்கப்படுகின்றது. கணனிமயமான பட்டியலாக்கப்பதிவுகளை தயாரிக்கின்ற பெரும்பாலான நூலகங்கள் தங்களது தேவைக்கு தக்கவாறு சிறு சிறு மாற்றங்களைச் செய்து 'Marc' பதிவுகளைப் பயன்படுத்தி வருகின்றது.

கணனிமயமான பட்டியலாக்கத்தினை தயாரிக்கின்ற நூலகங்கள் பதிவுகளுக்கான விபரங்களை Work Sheet இன் மூலம் கணனிக்கு உள்ளீடு செய்து வேண்டிய அறிவுறுத்துதல்களை வழங்குவதன் மூலம் குறிப்பிட்ட நூலகத்தில் உள்ள ஆவணங்களில் ஒரு விடயம் சார்பானவற்றையோ, தனி ஆசிரியர் ஒருவரின் சகல ஆக்கங்களையோ இது போன்ற வேறு விபரங்களையோ அச்சிடப்பட்ட பட்டியலாகப் பெற்றுக்கொள்ளலாம்.

ஒரு நூலகமானது கணனிப்பட்டியலை உபயோகிக்கும் போது குறிப்பாக தேவைக்குத்தக்கவாறு மாற்றங்களைச் செய்யவும், புதிய விபரங்களை இணைக்கவும், அதிகாரக்கோவைகளை பராமரிக்கத் தக்கதாகவும் அமைந்துவிடுவது அதன் சிறப்புத்தன்மைகளில் ஒன்றாகும், கணனி இலகுவாக மாற்றங்-

களைச் செய்யவும், மேலதிக விபரங்களை ஏற்கத்தக்கதாகவும், தேவையற்ற விபரங்களை அவசியமில்லாத போது நீக்கக்கூடியதாகவும் அமைந்து நூலக பட்டியலாக்கச் செயற்பாடுகளை இலகுபடுத்துகின்றதெனலாம்.

## சுழற்சி அல்லது நூல் இரவல் வழங்கல் (Circulation)

நூலக ஆவணங்களின் எண்ணிக்கை அதிகரித்து வருவதனால். வாசகர்கள் தமக்கு வேண்டிய எல்லா விடயங்களையும் நூலகத்தில் இருந்தே வாசித்து கிரகிக்க முடியாத நிலையில், நூல்களை தமது வீட்டுக்கு எடுத்துச் சென்று வாசித்து பயனடைய எடுக்கப்பட்டுள்ள நடவடிக்கையே நூல் இரவல் வழங்கலாகும்.

வாசகரொருவருக்கு நூல் இரவல் வழங்கும் போது அவரது விபரங்கள், நூலை மீளப்பெறும் திகதி பற்றிய விபரம். புதுப்பித்தல், ஒதுக்கீடு செய்தல், நூலகத்திற்கு திருப்பி ஒப்படைக்க தாமதமான நூல்களுக்கு நினைவுறுத்தற்கடிதம் அனுப்புதல் போன்ற பல்வேறு செயற்பாடுகளையும் சுழற்சி அல்லது நூல் இரவல் வழங்கும் நடவடிக்கையாகக் கருதலாம்.

மேற்குறிப்பிட்ட நடவடிக்கைகளை கணனிமயப்படுத்துவதனால் மிகவும் எளிதாக வேண்டிய அறிவுறுத்துதல்களை வழங்கி, குறிப்பிட்ட ஒரு வாசகரால் பெற்றுக்கொள்ளப்பட்ட நூல்கள், உரிய காலத்தில் நூலகத்திற்கு கையளிக்கப்படாதவிடத்து, நினைவுறுத்தல் கடிதம் தயாரித்தல், புள்ளிவிபரம் ( Statistics ) தயாரித்தல் போன்ற சகல நடவடிக்கைகளையும் செய்து கொள்ளலாம்.

## நூலக தகவற் சேவை (Information Service)

கணனிமயமான நூலக நடவடிக்கைகளில் தகவற்சேவை மிகவும் இன்றியமையாத செயற்பாடாக உள்ளது. நூலகத்திலுள்ள சகலவிதமான ஆவணங்களுக்குமான பதிவுகளை சேமித்துவைப்பதன் மூலம் வாசகர்களது தேவைக்கேற்ப, வேண்டிய தகவல்களை மீளப்பெறவும், அச்சிடப்பட்ட பிரதியாகப்பெறவும் கணனி இடமளிக்கின்றது. கணனியில் உள்ளீடு ( Input ) செய்து சேமித்து வைத்துள்ள தகவல்கள், வேண்டிய அறிவுறுத்துதல்களை வழங்குமிடத்து வாசகருக்கு குறுகிய நேரத்தில் பெறக்கூடியதாக இருக்கும். நூலகமெண்றினது முக்கியமான சேவையாக தகவல் சேவை விளங்குகின்றது.

மேலும் தயாரிக்கப்பட்ட பதிவுகளைக்கொண்டு நூலகத்திற் புதிதாகச் சேர்த்துக்கொள்ளப்பட்ட நூல்களின் பட்டியை அச்சிடப்பட்ட பிரதியாக பெற்றுக் கொள்ளவும் கணனி உதவுகின்றது. பட்டியல் பதிவுகளை தயாரித்து கூட்டிணைப்புப் பட்டியலை தயாரிப்பதற்கு மையநூலகத் ( Centre Library ) திற்கு வழங்கலாம். இவ்வாறாக விரைவாக வாசகர்களுக்கு தகவல் வழங்கக் கணனி உதவுகின்றது.

நவீன வசதிகளைக் கொண்டதாக நூலகங்களின் தரத்தை உயர்த்துவதற்கும், தேசிய ரீதியில் நூலக வளங்களைச் சகல வாசகர்களும் பெற்றுப் பயனடைய உதவுவதற்கும் நூலகங்களுக்கு கணனியின் அறிமுகம் அவசியமாகின்றது.

## පුස්තකාල ප්‍රවෘත්ති පාඨකයින් වෙතටයි

1990 වසරේ මුල් කලාපයේ සිට මේ දක්වා නිකුත් වූ ''පුස්තකාල ප්‍රවෘත්ති'' සහරාවන්හි අන්තර්ගතය හා සැලසුමෙහි වෙනස්කම් රාශියක් සිදුකර ඇති බව ඔබ දන්නා කරුණකි.

මෙම වෙනස්කම් පිළිබඳව පාඨක ඔබගේ ප්‍රතිචාර ''පුස්තකාල ප්‍රවෘත්ති'' නිරතුරුවම බලාපොරොත්තු වේ. මන්ද පාඨක ඔබගේ නිවැරදි මඟ පෙන්වීම ''පුස්තකාල ප්‍රවෘත්ති'' තවදුරටත් නිවැරදි එල්ලය කරා ගෙනයාමට උපකාර වන හෙයිනි.

එහෙයින් ඔබගේ ප්‍රතිචාර පහත ලිපිනයට යොමු කරන්න.

**ප්‍රධාන සංස්කාරක,**
**පුස්තකාල ප්‍රවෘත්ති,**
**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,**
**නිදහස් මාවත,**
**කොළඹ 07**
**දුරකථනය 698847**

# NEWS

## CONSERVATION PROJECT

The National Library of Sri Lanka has launched an Island wide library conservation and preservation project. The purpose of the project is to make the library authorities and librarians aware regarding the importance of Conservation and Preservation of Library materials. The National Library has planed to have a series of seminars and training courses on the subject for librarians. It will also donate 40 Conservation Centres to 40 selected Libraries· These centres will comprise a binding table, binding equipments and a fumigation cupboard. It is hoped that this will pave the way for better conservation and preservation activities.

## LIBRARY EXPERT VISIT

Mr. Jacques Tocatlian, former Director of PGI — the General Information Programme of Unesco — came to Sri Lanka with his son, Mark, from the 17th to the 29th of May. On the 18th he delivered the National Library Lecture Series number 24 on the subject of "*International Co-operation in Expanding Access to Information.*" Following a few days of rest at the Coral Garden Hotel of Hikkaduwa, they enjoyed a Cultural Tour which included Kandy, Anuradhapura, Polonnaruwa, Sigiriya, Dambulla and Nuwara-Eliya. Mr. H. M. Gunaratne Banda Assistant Director of the Board accompanied them on the Tour. Following are Mr Tocatlian's. impressions:

"It has been like a dream. When I think of our trip, two exhilarating weeks unroll in my memory like a film in a matter of minutes. In a series of flashes I see......

Botanic gardens with acres of luxnriant flora...... Peaceful Temples and Shrines...... Royal residences of powerful kings...... Centers of Buddhist pilgrimage. The sacred-Bo tree...... Colossal rock-cut statues...... Exquisite carvings ......Beautiful dagabas......Slender and graceful monoliths...... amazing 1000 years old wall paintings...... Mountain Resorts...... Tea Plantations...... Water Falls...... Unforgettable sights......

Everywhere, smiling, kind and hospitable people... Everywhere, hard-working men and women blessed with serenity and grace...... People who pray, who struggle, who plough and harvest...... People who live in dignity and harmony with the surrounding nature......

Untroubled elephants, cows, birds and monkeys living peacefully and without fear...... Everywhere a sense of tranquility, respect and quietness......

Everywhere bountiful and juicy fruits of all colors and sizes. Inviting curries, ranging from the mild to the fiery...... Delicious seafoods...... Grilled Lobsters...... Succulant spicy dishes...... Drinking Coconuts......

And the gems, Batiks and handicrafts......

These images unroll in my memory like a dream in a matter of minutes...... In a series of flashes I also see the Driver bargahinng at roadside Stalls, before zigzaging his way with incredible dexterity between bicycles and cows...... I see a thousand and one smiles and I am already nostalgic, yearning to come back......"

## LIBRARY GRADING

The following libraries have been upgraded by the Sri Lanka National Library Services Board recently,

| | | |
|---|---|---|
| 1, | Library - Dept. of National Museum | Supra Grade |
| 2. | Library - Dept. of Fotest Conservation | Grade 1 |
| 3. | Library - International Centre for Training of Rural Leaders Embilipitiya | Grade 2 |
| 4. | Library - Ministry of Land Irrigation and Mahaweli Development | Grade 2 |
| 5. | Library - Samudra Devi Balika Maha Vidyalaya - Nugegoda | Grade 2 |

## LIBRARY AUTOMATION

ACCESS is a user-friendly interface, designed to enable users to retrieve information easily from a CDS/ISIS database. This has been developed at the Asian Institute of Technology (AIT) in Bangkok, Thailand.

## HELLIS

The HELLIS Focal Point has started the compilation of the bio-medical database and it will cover both published and unpublished literature produced during the last five years in the field. It has also planned to update the Union List of Periodicals in HELLIS Network Libraries.

පොකුණුවිට ප්‍රදීපා මහජන පුස්තකාලය
ශ්‍රීමත් ජනාධිපති තුමා අතින් විවෘත වීම
பொக்குனுவிட்ட பிரதீபா பொதுசன நூலகம்
அதிமேன்மை தங்கிய ஜனாதிபதி ரனசிங்க
பிரேமதாச அவர்களால் திறந்து
வைக்கப்பட்டது
The Inauguration of Pokunuvita Pradeepa Public
Library by the H. E. Ranasinghe Premadasa





බුත්තල ගම්උදව 14 වන සංවත්සර උත්සවයේදී
පාසැල් පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම
புத்தலயில் நடைபெற்ற கம் உதாவவில்
பாடசாலை நூலகங்களுக்கு புத்தகங்கள்
நன்-கொடையாக கொடுக்கப்படுகிறது
1992 ஜூன் 23
Donation of Books to School Librarians at
Gamudawa - Buttala - 1992

ප්‍රාදේශීය සභා පුස්තකාල කමිටු සාකච්ඡාව - පදවිය
பதவிய பிரதேச சபையின் நூலக
குழுக் கூட்டம்
Padaviya Pradesiya Saba Library Committee Meeting
1992. 02. 07 - 09






පොත් ප්‍රදර්ශනය - බත්තරමුල්ල
මහජන පුස්තකාලය
நூற்கண்காட்சி - பத்தரமுல்ல பொதுசன
நூலகம்
Book exhibition held at the Battaramulla Public Library




ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
පොත් ප්‍රදර්ශනය - අනුරාධපුර මහජන
පුස්තකාලය
இலங்கை தேசிய நூலக சேவைகள்
சபையின் நூற்கண்காட்சி - அனுராதபுர
பொதுசன நூலகம்
SLNLSB Book exhibition held at Anuradapura
Public Library
1992. 02. 07



පොත් ප්‍රදර්ශනය - කඩුවෙල මහජන පුස්තකාලය
நூற்கண்காட்சி - கடுவல் பொதுசன நூலகம்
Book exhibition held at the Kaduwela Public Library



පොත් ප්‍රදර්ශනය - නුගේගොඩ
සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය
நூற்கண்காட்சி - நுகேகொட
சமுத்திராதேவி பாலிகா மகாவித்தியாலயம்
Book exhibition held at the Samudradevi
Balika Maha Vidyalaya, Nugegoda




ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ
වාර්ෂික රැස්වීම - 1992
இலங்கை நூலக சங்கத்தின் 1992 ஆம்
ஆண்டிற்கான வருடாந்த பொதுக்கூட்டம்
1992 Annual General Meeting of
the Sri Lanka Library Association






මීගමුව මහජන පුස්තකාලයට යුනිසෙෆ් ආයතනයෙන්
පරිත්‍යාග කළ ජංගම පුස්තකාල රථය
நீர்கொழும்பு பொதுசன நூலகத்திற்கு ஐக்கிய
நாடுகள் சிறுவர் நிதியத்தினால் (யூனிசெவ்)
நன்கொடையாக கொடுக்கப்பட்ட
நடமாடும் நூலக வண்டி
Mobile Van donated by UNICEF to the Negombo Public Library



කථික තරඟය - මහව මහජන පුස්තකාලය
மகாவ பொதுசன நூலகத்திஞல் ஒழுங்குசெய்யப்பட்ட பேச்சுப்போட்டி
Oratory Contest organized by the Maho Public Library

කලුතර දර්ගා නගරයේ අල්හම්බ්‍රා විද්‍යාලයේ
නව පුස්තකාල ගොඩනැගිල්ල නිවාස රාජ්‍ය ඇමති ඉම්තියාස්
බාකීර් මාකර් මැතිතුමා අතින් විවෘත වීම
தர்க்காநகர் கழுத்துறை அல் ஹம்பரா பாடசாலை
நூலகத்தினை கௌரவ வீடமைப்பு ரஜாங்க
அமைச்சர் திரு. இம்தியாஸ் பக்கீர் மாக்கரிஞல்
திறந்து வைக்கப்படுகிறது
The opening of KL AL - HAMBRA School Library at Dharga Town by the Hon : Minister of State for Housing Mr. IMTHIAZ BAKEER MARKAR





පාසැල් පුස්තකාලයාධිපති
සම්මන්ත්‍රණය - ජාතික අධ්‍යාපන
ආයතනය, මහරගම
தேசியகல்வி நிறுவனத்திஞல்
ஒழுங்குசெய்யப்பட்ட பாடசாலை
நூலகர்களுக்கான கருத்தரங்கு
School Librarians Seminar organized by the National Institute of Education

# පුවත් ලුහුඬින්

### ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට දෙවසරක් සපිරේ

ශ්‍රී ලංකා පුස්තකාල ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් නිල වශයෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 1990 වර්ෂයේ අප්‍රේල් මස 27 වන දින ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා අතින් විවෘත විය. බෞද්ධ ආගමික වතාවත් වලට මුල් තැනක් දීමෙන් එම ඓතිහාසික අවස්ථාව වසරක් පාසා සැමරෙන වාර්ෂික පිරිත් පිංකම 1992 අප්‍රේල් 27 වන දින පැවති අතර, ඒ පිළිබඳ සපිරිකර සංඝගත දක්ෂිණාව ප්‍රදානය ඊට පසුදින පැවැත්විණි.

### ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක කටයුතු

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ තැන්පත්ව ඇති විශේෂ එකතුන් අතුරින් පුස්තකාල විද්‍යා එකතුව, අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘති එකතුව (ISBN) පරිගණක දත්ත පදනමට ඇතුලත් කර ඇත. එමෙන් ම යුනෙස්කෝ ලිපි අනුක්‍රමණිකාව පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කිරීම සිදු වෙමින් පවතී. යුනෙස්කෝ සංවිධානයෙන් බෙදා හරින ලද (CD/ISIS) පරිගණක මෘදු භාණ්ඩ උපයෝගී කරගෙන ඇති අතර තවත් පරිගණක දෙකක් මෙම වර්ෂයේ දී එකතු වීමෙන් පුස්තකාල ක්ෂේත්‍රයේ පරිගණක කටයුතු මගින් දත්ත නිරාවරණය කිරීමට පුළුල් වශයෙන් ඉඩ ප්‍රස්ථාව ලැබේ.

### යුනෙස්කෝ සංවිධානයේ හිටපු විඥපන සේවා අධ්‍යක්ෂවරයාගේ ශ්‍රී ලංකා සංචාරය

යුනෙස්කෝ සංවිධානයේ විඥපන සේවා පොදු වැඩ සටහන් භාරව සිටි අධ්‍යක්ෂ ජැක් ටොට්ලින් මහතා (Mr. Jacques Tocatllan) සංස්කෘතික සංචාරයක් සඳහා නොබෝද ශ්‍රී ලංකාවට පැමිණියේ ය. යුනෙස්කෝ සංවිධානයෙහි වසර ගණනාවක් සේවය කර ඇති මොහු ශ්‍රී ලංකා ජාතික පුස්තකාල දේශන මාලාවේ 24 වන දේශනය International Co-operation in expanding Access to Information යන මැයෙන් 1992 මැයි 18 වන දින මණ්ඩලීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

### ප්‍රාදේශීය සහා මට්ටමින් පුස්තකාල කමිටු පිහිටුවීම

ප්‍රාදේශිය සහා මට්ටමින් පිහිටුවා ඇති පාසැල්, මහජන විශේෂ පිරිවෙන් සහ ස්වේච්ඡා සංවිධාන පුස්තකාල කටයුතු මධ්‍යගත පුස්තකාලයක් මගින් සම්බන්ධීකරණය කිරීම, විමධ්‍යගත පරිපාලන ක්‍රමය නිසා හිමි වූ බලතල අනුව පුස්තකාල කටයුතු ප්‍රතිසංවිධානය කිරීම සහ ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරින් සහ විද්වතුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගැනීමේ අරමුණු වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ඉල්ලීම අනුව ප්‍රාදේශීය සභා මට්ටමින් පුස්තකාල කමිටු 161ක් පිහිටුවා ඇත.

මෙම කමිටු සමඟ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සම්බන්ධතාවයන් පුළුල් කිරීමට උතුරු මැද පළාතේ අනුරාධපුරය, පදවිය, රබෑව, කැබිතිගොල්ලෑව, මැදවච්චිය පුස්තකාල කමිටු සහ ඌව පළාතේ මොණරාගල, මඩුල්ල, බඩල්කුඹුර සහ දකුණු පළාතේ තිස්සමහාරාමය පුස්තකාල කමිටු හමුවීමට සහ සාකච්ඡා පැවැත්වීමට හැකි විය. ඒ ඒ පුස්තකාල ආශ්‍රිතව ඇති විශේෂිත ප්‍රශ්න හඳුනා ගැනීමටත් ඒවාට වෘත්තීමය උපදෙස් ලබා දීමටත් හැකිවීම ඵලදායි සේවාවකි.

### පුහුණු පාඨමාලා

ගම්පහ, දිවුලපිටිය හා මිනුවන්ගොඩ ප්‍රදේශවල පිරිවෙන් පුස්තකාල භාර ගුරු භවතුන් සඳහා තෙදින පුහුණු පාඨමාලාවක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මෙහෙයවීමෙන් 1992 මැයි 22, 23, 24 දිනවල දී ගම්පහ විද්‍යාශේඛර පිරිවෙනේ දී පැවැත්විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා දෙදින පුහුණු පාඨමාලාවක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සහ වයඹ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ මෙහෙයවීමෙන් 1992 මැයි 9-10 දින වල දී පැවැත්විය.

හම්බන්තොට හා සූරියවැව දැනට ක්‍රියාත්මක වන පා ගමන් පුස්තකාල සේවාවේ ඉදිරි පියවරක් ලෙස කටුවන ප්‍රදේශයේ ද ගම් 19 ක් මුල් කරගෙන පා ගමන් පුස්තකාල සේවාවක් ආරම්භ වේ. ඒ සඳහා එක්දින සේවා වැඩ මුළුවක් 1992 මැයි 19 දින හම්බන්තොට මහානාග මන්දිරයේ දී පැවැත්විය. එම වැඩ මුළුව හම්බන්තොට මහ දිසාපති ඩබ්ලිව්. ජී. මිත්‍රරත්න මහතාගේ උපදෙස් පරිදි සංවිධානය කර තිබුණි.

### ජනාධිපති ජංගම සේවය සඳහා පොත් අලෙවි හලක්

ජනාධිපති ජංගම සේවය 1992 මැයි 29, 30, 31 තෙදින තුළ දී වවුනියාවේ දී පැවති අතර ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් අලෙවි හලක් පැවැත්විය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල යටතේ ප්‍රකාශිත පොත් විශේෂ මිල අඩු කිරීම් යටතේ අලෙවිය සිදු විය.

### පුස්තකාල සඳහා නව ගොඩනැගිලි විවෘත වේ

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ නව ගොඩනැගිලි සංකීර්ණය ශ්‍රීමත් ජනාධිපතිතුමා අතින් 1992 ජූනි 11 දින විවෘත විය. පුස්තකාලය සඳහා වඩාත් ඉඩ පහසුකම් සහිත ස්ථානයක් වෙන් වී ඇති අතර පුස්තකාල විද්‍යානුකූලව ග්‍රන්ථ එකතුව සංවිධානය කිරීම නිම කර ඇත. මෙම පුස්තකාලය පර්යේෂණ කටයුතු සඳහා ඉවහල් කර ගන්නා

අයුරින් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පරිගණක දත්ත පදනමකට ඇතුලත් කිරීමට අපේක්ෂා කෙරෙන බැව් මහොපාධ්‍යාය කඹුරුගමුවේ වජිර ස්වාමීන් වහන්සේ පැවසූහ.

පොකුණුවිට ජනසෙත පදනමේ අනුග්‍රහයෙන් ඉදි වූ ප්‍රදීපා නව මහජන පුස්තකාලය ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා අතින් 1992 පෙබරවාරි 24 දින විවෘත විය. හොරණ, බණ්ඩාරගම, බුලත්සිංහල යන කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රදේශවලට යහපත් පුස්තකාල සේවාවක් ලබා දිය යුතු බව මෙම පදනමේ සභාපති පොල් කර්මාන්ත සහ බෝග විවිධාංගීකරණ අමාත්‍ය ඉන්ද්‍රදස හෙට්ටිආරච්චි මහතාගේ අපේක්ෂාවයි.

**බුදු දහම පිළිබඳ පර්යේෂණ සඳහා විමර්ශන පුස්තකාලයක්**

අස්ගිරි පාර්ශවයේ මහානායක ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් බුදු දහම පිළිබඳ තුලනාත්මක අධ්‍යයන කටයුතු වල නිරත වන පර්යේෂකයින් සඳහා ජාත්‍යන්තර බෞද්ධ පර්යේෂණ පුස්තකාලයක් 1992 අප්‍රේල් 10 දින ශ්‍රීමත් ජනාධිපතිතුමා අතින් විවෘත විය.

මහනුවර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් රු. 5555.50 ක් වටිනා පොත් ද, රු. 23250– ක් වටිනා දෘව උපකරණ ද පරිත්‍යාග කරනු ලැබී ය.


**විදේශීය අධ්‍යාපන කටයුතු**

කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥපන විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන පියදාස රණසිංහ මහතා අධි ශිෂ්‍යත්වයක් ලැබ මෙම ජුනි මස 01 දින දිවයිනෙන් බැහැර විය. ඒ මහතා, තම පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතු සඳහා ඕස්ට්‍රේලියාවේ, නිව් සවුත්වේල්ස් විශ්වවිද්‍යාලයේ පුස්තකාල-විද්‍යා, විඥපන විද්‍යා හා අධිලේඛන විද්‍යා පිළිබඳ අධ්‍යයන ආයතනයෙහි අධ්‍යයන කාර්යයන්හි නිරත වනු ඇත. "ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ ඉතිහාසය විකාශනය සහ සංවර්ධනය" පිළිබඳ විශේෂ අධ්‍යයනයක නියැලී ශ්‍රී ලංකාවට අදාල ව තම පර්යේෂණ කටයුතු මෙහෙය වීම ඒ මහතාගේ අපේක්ෂාවයි.

**මානව අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සම්මේලන**

මානව අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු හා ප්‍රලේඛණ සේවා පද්ධතිය (Huridocs) විසින් ඉහත සම්මේලනය 04. 05. 92 සිට 07. 05. 92 දිනයන්හි ග්‍රීසියට අයත් ක්‍රීට් දිවයිනෙහි පවත්වන ලදී. සම්මේලනයේ අවසාන සැසි වාරය සමඟ ම Huridocs හි මහා සභා රැස්වීම ද පවත්වන ලදී. විවිධ රටවල මානව අයිතිවාසිකම් මධ්‍යස්ථාන 150 ක පමණ (Huridocs) හි සාමාජිකත්වය දරණ අතර සම්මේලනය සඳහා ඒවායේ නියෝජිතවරු මෙන් ම Huridocs හි සාමාජිකත්වය නොලත් එහෙත් මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රලේඛණ කටයුතුවල නිරත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළුව නියෝජිතවරු 165 ක් පමණ සහභාගී වූහ. මෙහි මූලික පරමාර්ථ වූයේ මානව අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු ප්‍රලේඛණය ප්‍රමිතිකරණය කිරීම, ඊට අදළ තොරතුරු මූලාශ්‍ර හඳුන්වාදීම, අදළ විවිධ ආයතන හා ඒවායේ ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ඇති කිරීම මෙන් ම ඉදිරි පස් වසර තුළ Huridocs මගින් වැඩි අවධානයක් යොමු කළ යුතු කාර්යයන් පිළිබඳව නිර්දේශ සකස් කිරීමත් ය. ඉහත සම්මේලනය සඳහා Huridocs විසින් කරන ලද ආරාධනය පරිදි ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නාලිනී ද සිල්වා මිය ඊට සහභාගි වූවාය.

**පත්කිරීම**



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් හා එම මණ්ඩලයේ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයා ලෙස ඩබ්. ආනන්ද සොයිසා මහතා පත් කර ඇත.

බලපිටිය, කොස්ගොඩ පියගම ග්‍රාමයේ උපත ලද ආනන්ද සොයිසා මහතා අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය, අවිස්සාවේල්ල සීතාවක මහා විද්‍යාලය, රත්නපුර ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ හා කොළඹ ස්ටැපඩ් විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇත.

# University Libraries of Sri Lanka

**Sumana Jayasuriya**

*Chief Librarion - Uuiversity of Colombo.*

Establishment of Universities in Sri Lanka was a recent development. The first university in Sri Lanka is the 'University of Ceylon' which was established on 1st July 1942 by the Ceylon University ordinance No. 20 of 1942, amalgamating the Ceylon University College and the Ceylon Medical College. The University was to be located in Peradeniya and was to be unitary, residential and autonomous. Until the buildings were completed the university functioned in the premises of the University College, Colombo. By 1960, faculties of Agriculture, Vet. Sc. Arts and Oriental Studies were shifted to Peradeniya but part of faculty of Science and the faculty of Medicine and Engineering remained in Colombo.

By this time, however, the demand for higher education had increased tremendously. This was a direct result of the introduction of the free education in 1945 and the use of national languages as the media of instruction. The number of students seeking admission to universities were 904 in 1942 and 3,684 in 1960. There was also increased pressure from the Govt. to provide instruction in national languages.

To meet these needs, the Vidyalankara and Vidyodaya pirivenas, Centres of traditional Buddhits learning were elevated to the status of universities. The shift to Peradeniya was halted midstream, and faculties of Sc. and Medicine were established at Peradeniya. Between 1963 and 1965 student numbers increased and classes were provided in all three languages. Admissions to Arts and Social Sciences to University of Ceylon rose to 3,990 in 1964 and a second faculty of Arts was established in Colombo making use of the 'Race Course premises.' The administration was done from one central office in Peradeniya.

With the implementation of the Higher Education Act No. 20 of 1966, all existing universities were brought under the National Council of Higher Education (NCHE). During this period a Central Admission Bureau was established to co-ordinate admission to universities. In 1967, University of Colombo was given autonomous status and College of Advanced Technology, Katubedde was elevated to the status of a university and came to be known as the University of Moratuwa.

By 1970, changes were taking place in the university system. University of Ceylon Act no. 1 of 1972, which came into operation on the 5th Feb. 1972 reduced the status of the four universities and were made Campuses of the 'University of Sri Lanka.' Jaffna campus were started in 1974. The main objective of this reorganization was to avoid unnecessary duplication of course and departments of study in these universities. This act was never implemented in full, but was replaced by the Universities Act no. 16 of 1978, which gave back autonomous status to universities. The chief feature of the newly introduced system was the establishment of the UGC, which among other things allocated funds to universities, formulated policies of university admissions and language of instruction.

A university college of Ruhuna was created at Ruhuna, which became the University of Ruhuna in 1984. The Open University was established in 1980. The University College of Batticaloa founded in 1981 became the Eastern University of Sri Lanka in 1986.

The Universities (Amendment) Act No. 7 of 1985, made provision for the establishment of degree awarding institutes. Thus the NCMC, a private fee levying college was established and their students were to receive degrees from the University of Colombo. Due to protests from various quarters the NCMC was made a part of the national university system in 1989.

Another significant development in the university system is the establishment of affiliated University Colleges in 1991. These institutions will provide courses for those students who reach the minimum aggregate for admission to universities, but are left out from the national universities.

**Development of university libraries :**

The library of University of Ceylon, being the only university library in existence until the establishment of Universities of Kelaniya and Sri Jayawardenepura in 1959, had several advantages. The library inherited the collection of Ceylon University College and with generous funding from the government, the library was able to build up its collections. The library also received donations of several valuable private collections to enrich its Ceyloniana collection, which until today remains as one of the best collections on Sri Lankan studies.

In 1952, the university library was identified as the legal deposit library and became the receipient of all published material in Sri Lanka. The library also had the added advantage of having two dynamic librarians, Mr. R. S. Enright and Mr. S. C. Blok at the initial stages of library development. They improved the library to such an extent that in the absence of a national library, it discharged certain functions expected of a National library such as providing bibliographical services to South East Asia Co-operation office at New Delhi and the International Committee on Documentation of Social Sciences at Paris.

Beginnings of 1960s saw the dawn of a new era in the history of library development. Before the end of the decade four new universities were established and these inherited basic collections to start with. The two Buddhist Centres of learning Vidyalankara pirivena established in 1875 and the Vidyodaya pirivena established in 1873, had very rich collections in Buddhist Studies. When these centres were elevated to the status of universities, their collections became nucleus of these libraries.

The third university to be established in this period was the university of Colombo, established in 1967. The Colombo university library remained as a branch library of the university of Peradeniya from 1963, and in 1967, with the seperation from Peradeniya the library became a seperate and indipendent library

The Ceylon College of Technology, Katubedde was raised to the status of a campus in 1972, and the library of the College became the library of the newly founded campus. The Jaffna campus was started in 1974, and the Jaffna College library which started as a seminary library in 1823 and had a very good collection of books became the university library.

During this decade, the libraries increased their resources, by strenghtening their book collections organized and improved their services to readers, and took measures to train their personnel. Funding to libraries kept on the increase and as a result acquisitions of books and periodicals increased. The combined book stock of these four libraries had increased from 170657 in 1960 to 453,112 in 1970. More funds were allocated to build up undergraduate allocations and to acquire learned journals.

From early 1970s the libraries had to curtail their periodical subscriptions due to foreign exchange restrictions imposed by the central governments and also due to inadequate funding. Majority of the books and 90% of the periodicals were foreign periodicals. The problem became so intense that universityl ibraries had todo without asingle periodical in 1973 and 1974. The libraries had started exchange programmes with foreign institutions and journals received on exchange and donation increased over the years. Paucity of scholarly publications however was a limiting factor to the expansion of exchange programmes. The situation improved towards the end of 1970s.

Since the establishment of the UGC in 1978, it allocated funds to universities. The UGC however, did not decide in the proportion to be allocated to libraries. The allocations were made by the individual universities, but no rationalistic or scientific formula was followed when making such allocations. Until the mid eighties, the libraries could manage with the allocation to a certain extent, but with rapid growth of academic courses cutting across various subject disciplines and the need to acquire multiple copies of undergraduate texts to cater to the increasing number of undergraduates have made the library allocations grossly inadeanate.

*Staff structure :* The university library is headed by the librarian who is one of the full time officers of the university, along with the Vice-chancellor and the Registrar (Ceylon University Ordinance No. 20, 1942) and the position has been maintained in the subsequent Acts, including the Act 16 of 1978 which is in force today, He is also an ex-officio member

of the senate which is the academic authority of the university and holds a post equivalent to a university professor.

Under the provisions of 39(2) of the Act, "the Librarian shall, subject to the direction and control of the Vice-Chancellor, be responsible for the administration of the library or libraries of the university." There is also provision under the act to appoint a senate library committee to assist in the matters relating to library administration.

*Key staff of the university library is the professional staff:* The Librarian, Deputy Librarian, Senior Asst. Librarian, and the Asst. Librarian. Their grades and salary scales run parrellel to academic grades of Professor, Associate Professor, Senior Lecturer, and the lecturer and enjoy other privilege such as sabbatical leave and retirement benefits.

The largest group in a university library staff is the library assistants, who carryout the bulk of routine work. They join the university with O'level and most of them, now follow professional courses, conducted by the Sri Lanka Library Association or the University of Kelaniya but avenues of promotion are very limited. Their salaries are equivalent to clerical grades. The training required by the library assistants are proficiency in typing and the other skills he learns by experience. Not much attention have been paid for in-service training, specially due to lack of appropriate senior staff and due pressure of other duties.

In Dec. 1986, His Excellency the President and the Minister of Higher Education called for information on the university libraries with regard to their adequacy, availability of funds and any other matters relevant, to enable him to decide on the further steps that should be taken to raise their standards. Accordingly a meeting of the Vice-Chancellors and librarians with the Chairman UGC was convened on 6 Jan. 1987. The librarians drew the attention to several important matters such as lack of adequate physical accomodation, insufficiency of trained staff, inadequacy of funds, automation. It was decided at the meeting to recommend to the UGC to formulate a Committee comprising ofall librarians of universities to have a closer dialogue of this nature. Approval for the formation of the Inter-University Committee of Librarians was given in May 1987, and this committee up to now has met regularly and made several suggestions to upgrade the status of librarians and libraries.

The Committee also has gone into the question of library education in the country and had submitted a proposal to establish a Post-graduate Institute of library and Information sciences.

*Automation :* Another important subject which was taken up by the IUCL was the automation of libraries. The librarian, university of Peradeniya submitted a memorandum detailing the needs of such a computerized system and how the project implementation should be phased out. In Sep. 1988, under the aegies of the BC stephen W. Massil of
visited Sri Lanka to meet university librarians and discuss draft plans for library computerization programmes, and to advise on implementation. Use of CDS/ISIS software and training of staff was also discussed. The librarians were given a micro-computer each by Jan. 1991, the university librarians after several meetings decided on the use of CDS/ISIS software and on a common worksheet to facilitate networking in the future.

**Current status :**

The University librarians today are confronted with a great challenge. They are faced with the onerous task of providing facilities for teaching studying and research with a low budget, limited number of professionals and very little physical facilities.

The UGC is trying to provide for the three batches of students who are awaiting entry to universities by admitting double batches to some faculties and increasing the intake by 35%. Accelerated study programmes have been introduced, to catch up on lost time. Total undergraduate student enrolment in 1989/1990 is 28260 and post-graduate student enrolment is 27256. Several new courses have been introduced which requires the acquisition of new books and periodicals.

Lack of financial support and the low priority given to libraries by the university authorities have made the task of librarian more difficult. The UGC has

changed its funding system to per capita system, but the increase in the price of books and periodicals qas no relation to the number of students in a university, therefore the allocations should depend on the number of faculties, courses offered by these faculties, research programmes etc.

The conversion rates of foreign currencies have made the Sri Lankan rupee allocations meaningless as 90% of books and periodicals purchased by universities are foreign publications. Hence the university librarians during the past few years had to do without much needed books and periodicals.

This has affected the libraries very badly and also the teaching programmes. The time has come now to seriously think of increasing the budgetary allocations to procure the latest books and periodicals for the use of readers. If not the university libraries may soon become museum pieces.


## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය
### ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1962

සංස්කරණය, ප්‍රකාශනය හා බෙදාහැරීම: ග්‍රන්ථනාමාවලි අංශය,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**වාර්ෂික දායක මුදල (තැ. ගා. සමඟ)**

| | |
|---|---|
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය | රු. 180.00 |
| සමුච්චිත ජාතික ග්‍රන්ථ නාමාවලිය 1987 | රු. 100.00 |
| ළමා ග්‍රන්ථ නාමාවලිය 1988 | රු. 20.00 |

චෙක්පත්, මුදල් ඇණවුම් තැපැල් ඇණවුම්:
සභාපති,
''ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය''
නමින් ලියන්න.

**විමසීම**
සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ 07.
දුරකථන : 685195, 698847

# බ්‍රේල් මුද්‍රණාලය සහ ශ්‍රී ලංකාවේ අන්ධ අය සඳහා බ්‍රේල් පොත් ප්‍රකාශනය

**ඩී. බී. කොස්වත්ත**

කළමනාකරු:

බ්‍රේල් මුද්‍රණාලය - මහරගම

## බ්‍රේල් මාධ්‍යයේ ආරම්භය

සත්ත්වයින් අතරින් උසස් මනසකින් යුතුව කටයුතු කිරීමේ හැකියාව ලැබී ඇත්තේ මිනිසාට ය. චිත්ත ශක්තියෙන් උසස් මිනිසා ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කර ගැනීමේ දී විවිධ ක්‍රම භාවිතා කර ඇති බව ඓතිහාසික පොතපත කියවීමේ දී අපට පෙණේ. තොරතුරු සන්නිවේදනයේ දී වාචික මාධ්‍ය මෙන් ම ලිඛිත මාධ්‍යය ද එකසේ වැදගත් වේ. ජාතියක සංස්කෘතික හා සමාජයීය වශයෙන් වූ අඛණ්ඩ පැවැත්මේ දී පවා ලිඛිත ඉතිහාසය ඉතා වැදගත් ය. වර්තමානයේ දී මිනිසා විද්‍යාත්මක හා තාක්ෂණික අංශයෙන් ඉහළම සන්ධිස්ථානයකට පැමිණ ඇති බව නොකිවමනා ය. මෙහි දී මුද්‍රණ අංශය ප්‍රධාන ස්ථානයක් ගෙන ඇත. මෙසේ දියුණු තත්ත්වයකට පැමිණීමට පෙර මිනිසාගේ මුල්ම සමාජයීය සංවිධානය වූ යාන්ත්‍රික සමාජ යුගය දක්වා මිනිසාගේ ප්‍රකාශන ඉතිහාසය පැවති ඇති බවට නොයෙකුත් සාක්ෂි ඇත. ගස්වල, ගල්වල විවිධ සළකුණු යෙදීමෙන් තම අදහස් තවත් කෙනෙකුට ප්‍රකාශ කර තිබේ. එමෙන්ම වර්තමානයේ දී අපට දැකිය හැකි පැරණි සෙල්ලිපි වලින් ද හැවසෙනුයේ අතීතයේ දී භාවිතා කර ඇති සංනිවේදන ක්‍රමයන් ය. අක්ෂර වින්‍යාසය යුගයෙන් යුගයට වෙනස් වී ඇති වුව ද ලිඛිත ක්‍රමයක් භාවිතා කර ඇති බව ස්ථිර ය.

දෙනෙත් පෙනෙන අය සඳහා අදහස් ප්‍රකාශ කිරීමේ ලිඛිත මාධ්‍යයක් තිබුණත් දෙනෙත් අඳ පුද්ගලයින් සඳහා මෙවැනි මාධ්‍යයක් තිබුණු බවට ඇත ඉතිහාසය සාක්ෂි නොදරයි. ආසියාතික රටවල් දෙස සලකා බැලූ විට ශ්‍රී ලංකාව තුළ මේ සඳහා පවතින්නේ ඉතාමත් කෙටි ඉතිහාසයකි. අතීතයත් වර්තමානයත් සලකා බලන විට අද දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට විශේෂිත ඉගෙනීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ කටයුතු සිදු කළ හැකි මාධ්‍යයක් ගොඩනැඟී ඇත. මේ සඳහා ප්‍රධාන හේතු සාධකය ලෙස ප්‍රංශ ජාතික ලුවී බ්‍රේල් විසින් නිර්මාණය කරන ලද බ්‍රේල් මාධ්‍යය සැලකිය හැකි ය. ප්‍රංශ ජාතික මොහු විසින් නිර්මාණය කරන ලද බ්‍රේල් මාධ්‍යය ඇති වූවාට පසුව ලෝකයේ දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ කියවීම හා ලිවීම ආරම්භ වන්නට ඇතැයි සිතිය හැකි ය. ලුවී බ්‍රේල් මෙලොවට බිහි වී ඇත්තේ නෙත් හැර ලෝකය දෙස බැලීමේ වරම් ලද්දකු ලෙසිනි. හදිසි අනතුරකින් පසු කල අන්ධ පුද්ගලයකු වූ ලුවී බ්‍රේල් මෙම ක්‍රමය සොයා ගැනීමට පෙර ද දෘශ්‍යාබාධිතයින්ගේ අදහස් ප්‍රකාශනය සඳහා යම්කිසි මාධ්‍යයක් තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

ලුවී බ්‍රේල් හුණු පාසලේ ඉගෙනුම ලැබීමෙන් පෙනෙන්නේ එවැනි මාධ්‍යයක් තිබෙන්නට ඇති බව ය. නමුත් වෙනත් ඓතිහාසික තොරතුරු නොමැති නිසා එය ප්‍රබල සාක්ෂියක් ලෙස සැලකිය නොහැකි ය. මේ පිළිබඳව විස්තර වාර්තා නොවන්නේ එම ක්‍රමය එතරම් ප්‍රචලිත දියුණු ක්‍රමයක් නොවූ නිසා ද විය හැකි ය. ලුවී බ්‍රේල් පවා අධ්‍යාපනය ලබා ඇත්තේ එවැනි ම මාධ්‍යයක් තුළිනි. එම ක්‍රමයෙහි ඇති නොදියුණු බව නිසා හෝ දෘශ්‍යාබාධිත අයගේ අදහස් ප්‍රකාශනයේ දී එම ක්‍රමයේ ඇති ගැටළු සහගත තත්ත්වයන් නිසා හෝ මේ සඳහා වෙනත් ක්‍රමයක අවශ්‍යතාවය ඒ යුගයේ දී ප්‍රබල ලෙස දැනෙන්නට ඇත. මේ දුක් කම්කටොලු බාධක සියල්ලන්ට ම ලුවී බ්‍රේල් ද මුහුණ දෙන්නට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු විසින් ක්‍රි.ව. 1912 දී බ්‍රේල් ක්‍රමය හඳුන්වා දී තිබේ. ඔහුගේ මුල් ම සොයා ගැනීම බැවින් මෙහි යම්කිසි අඩුපාඩු නොතිබුනා නොවේ. නමුත් එකල ප්‍රංශයේ පැවති ජන සමාජය ඔහු විසින් නිර්මාණය කළ එම සොයා ගැනීමට මුල් තැන දී කටයුතු නොකළහ ; නොපිළිගත්හ. ඔහුගේ ප්‍රථම සමාජය වූ හුණු පාසලේ ඇදුරුවරුන් ද එම සොයා ගැනීම එතරම් අගය නොකළ බව වාර්තා වේ. මෙයින් ලුවී බ්‍රේල් දුක් වූ නමුත් පසුබට නොවී ය. දෘශ්‍යාබාධිත පුද්ගලයින්ට ප්‍රයෝජනවත් මාධ්‍යයක් ලෙස බ්‍රේල් මාධ්‍යය ඇමරිකාව, එංගලන්තය වැනි රටවල් පිළිගත් අතර ප්‍රංශ ජාතිකයන් එය පිළිගත්තේ තවත් කාලාන්තරයක් ගිය පසුව ය. එමෙන් ම තමා උගත් පාසලේ පවා එය පිළිගත්තේ සෑහෙන කාලයක් ගිය පසුව ය. ලුවීට කරන ලද සම්මානයක් ලෙස අද මෙය බ්‍රේල් මාධ්‍යය ලෙසින් නම් කර ඇත. මේ වන විටත් අධ්‍යාපනය අතින් පසුබට වෙමින් සිටි දෘශ්‍යාබාධිත ජනතාවට මෙම මාධ්‍යය නිසා නව පුනර්ජීවයක් ලැබුණි.

## දෘශ්‍යාබාධිතයන් සඳහා ඇති ලිඛිත මාධ්‍යය

වර්තමානයේ බ්‍රේල් ක්‍රමය විශාල දියුණුවක් ලබා දෘශ්‍යාබාධිතයින් සඳහා ඇති එක ම ලිඛිත ප්‍රකාශන මාධ්‍යය ලෙස අන්තර් ජාතික වශයෙන් පිළිගෙන තිබේ. ලොව පුරා විසිරී සිටින දෘශ්‍යාබාධිතයින් සඳහා මෙම බ්‍රේල් මාධ්‍යය මහඟු සේවයක් ඉටු කරයි. මෙම මාධ්‍යය මඟින් ඔවුනට අධ්‍යාපනය ලැබීමට, අදහස් ප්‍රකාශ කිරීමට ලැබෙන පිටුවහල සුළුපටු නොවේ. අතීතයේ දී දෘශ්‍යාබාධිත දරුවන් බිහි වූ දෙමාපියෝ දුක් සුසුම් හෙළමින් ඔවුනට අධ්‍යාපනයක් ලබා දීමට

නොහැකිව ලත වූහ. නමුත් අද එවැනි ඉරණමක් එම දරුවනට ඇති නොවේ. සාමාන්‍ය මිනිසාගේ ප්‍රකාශන මාධ්‍යයට ආසන්නව ම දෘශ්‍යාබාධිත දරුවන්ගේ ප්‍රකාශන මාධ්‍යයේ ද සීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇත. බ්රේල් මාධ්‍යය ලොවට හඳුන්වා දුන් මුල් අවධියේදී ම ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පොත පත ඉතා විරල විය. ලියවුණු පතපොත කියවීමට, ලිවීමට අධ්‍යාපනය ලැබීමට ඇති නැඹුරුව ඉතා පහත් මට්ටමක පැවතුණි. එම නිසා මෙම මාධ්‍යය ඉතා දියුණු තත්ත්වයකට පත් වීමට කාලාන්තරයක් ගත වී ඇත. වර්තමාන මුද්‍රණ කටයුතුවල දී සාමාන්‍ය මුද්‍රණ කටයුතු සඳහා ඉතාමත් දියුණු විද්‍යාත්මක තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගැනීම බෙහෙවින් සිදුවේ. උදාහරණයක් ලෙස අධිවේග ලිතෝ මුද්‍රණ කටයුතු ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමය ආදිය හැඳින්විය හැකි ය. සාමාන්‍ය මුද්‍රණ ශිල්පය විද්‍යාත්මක ව දියුණුවක් ලබා ඇති අතර බ්රේල් මුද්‍රණ ක්‍රමය ද තාක්ෂණික රැල්ලට හසු වී සෑහෙන දියුණුවක් ලබා තිබේ. මේ අනුව බ්රේල් මුද්‍රණය සඳහා දියුණු නවීනතම යන්ත්‍ර උපකරණ තාක්ෂණික ලෙස නිපදවා ඇත. විශේෂයෙන් ම කාර්මික හා වාණිජ වශයෙන් දියුණු වන බටහිර රටවල මෙම දියුණු තාක්ෂණය මගින් අවශ්‍ය මුද්‍රිත පත පොත බිහි කර ඇත. ඒ අනුව ජනතාව සඳහා සාමාන්‍ය ප්‍රකාශනවලට සමාන ව දෘශ්‍යාබාධිතයින්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පත පොත ද මුද්‍රණ ද්වාරයෙන් පිට කිරීමට එම රටවල් උත්සුක වූහ. එම බ්රේල් ප්‍රකාශනවල පිටුවහල ලබමින් තම දැනුම, අවබෝධය ප්‍රගුණ කළ දෘශ්‍යාබාධිත පුද්ගලයින් ලොව විවිධ ක්ෂේත්‍රවල තම දස්කම් දක්වමින් තම අන්ධභාවය පරදවා ඇත.

## බ්රේල් මාධ්‍යයෙන් පොත් ප්‍රකාශනය

බ්රේල් මාධ්‍යයෙන් ඉගෙනුම ලබා සරසවි වරම් ලද සිසුහු ද සරසවිවල උසස් අධ්‍යාපනය ලබන සිසුහු මෙන් ම එම අධ්‍යාපනය ලබා දෙන ඇදුරෝ ද ලොව දස දෙස සිටිති. බ්‍රිතාන්‍යයේ සේනානි මිෂනාරි සමාගම මගින් ශ්‍රී ලංකාවේ ප්‍රථම දෘශ්‍යාබාධිත පාසල රත්මලානේ ස්ථාපිත කරන ලදී. එවකට සමාජයේ පැවති අධ්‍යාපනික පසුතලය අනුව මෙම අන්ධ විද්‍යාලයේ ඉගෙනුම සඳහා යා ගත හැකි වී ඇත්තේ දෘශ්‍යාබාධිතයින් ඉතා සුළු පිරිසකට ය. (නේවාසික පාසලක් වූ නිසා ආගමික වාතාවරණයකින් යුක්ත වූ බැවින් ද අන්ධ අධ්‍යාපනය ගැන දැනුමක් සමාජයට නොතිබූ බැවින් ද මෙම පාසලේ අධ්‍යාපනය ලැබුවේ ඉතාමත් සුළු පිරිසකි.) ක්‍රම ක්‍රමයෙන් ලංකාවේ අනෙකුත් ප්‍රදේශයන්හි ද දෘශ්‍යාබාධිතයින් සඳහා නේවාසික පාසල් ආරම්භ කරන ලදී. මේ සියල්ල ම පාහේ ස්වේච්ඡා සංවිධාන මගින් ආරම්භ කර පාලනය කරන ලද ඒවා ය. මෙම පාසල්වලට ඇතුළත් වන දෘශ්‍යාබාධිතයිනට අවශ්‍ය වන පොතපත මුද්‍රණය කිරීම සඳහා එවකට ශ්‍රී ලංකාවේ මුද්‍රණාලයක් නොතිබුණි. එමනිසා මෙහි ඉගෙනුම ලබන සිසුන්ට පත පොතෙහි හිඟකම බලවත් ලෙස දැනුණි. ඉංග්‍රීසි අධ්‍යාපනයට මූලික ස්ථානයක් හිමි වී තිබුණු මෙම යුගයේ දී ඔවුනට අවශ්‍ය පොත් ඇමරිකාව, එංගලන්තය, ඉන්දියාව වැනි රටවලින් පරිත්‍යාග වශයෙන් ලැබුණි. ශ්‍රී ලංකාවේ සිටින දෘශ්‍යාබාධිතයින් සියලු දෙනාට ම තම භාෂාවෙන් ඉගැන්වීමට කටයුතු සැලසීමට රත්මලාන නේවාසික පාසලේ විදුහල්පති වශයෙන් සේවය කළ දසනායක මහත්මා දැඩි උත්සාහයක් ගත්තේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එතුමා ඉංග්‍රීසි බ්රේල් හෝඩියේ ආධාරයෙන් සිංහල බ්රේල් හෝඩියක් නිර්මාණය කරන ලදී. මෙය එතුමා විසින් ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිතයින් සම්බන්ධයෙන් ගත් වැදගත් පියවරක් විය. ලංකාවේ දෘශ්‍යාබාධිත ජනතාවගේ දැනුම අවබෝධය අභුරා ගෙන තිබූ මෙම කාර්යයේ සම්පූර්ණ ගෞරවය විදුහල්පති දසනායක මහතාට හිමි විය යුතු ය.

සිංහල බ්රේල් මාධ්‍යය උපයෝගී කර ගෙන දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා පොත පත සුළු වශයෙන් තම පාසල් තුළ දී ම සකසා ගත් අතර ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට අනුව ප්‍රකාශන නිපදවීම සිදුනොවී ය. පොත්පත් කියවීමේ පිපාසයෙන් දෘශ්‍යාබාධිත සිසුහු පෙළුණහ. සිංහල බ්රේල් මාධ්‍යය නිර්මාණය කිරීමත් සමඟ ම එකී මාධ්‍යය ග්‍රහනය කර ගෙන දෙනෙතින් ලොව දැකීම වෙනුවට ස්පර්ෂයෙන් ලොව දැකීමේ භාග්‍යය ලැබුණු දෘශ්‍යාබාධිත පිරිස ක්‍රමයෙන් පුළුල් විය. සිසුන්ගේ පොත් කියවීමේ පිපාසය සන්සිඳවීම සඳහා තිබුණු පත පොතේ අල්ප බව සමනය කිරීම සඳහා ස්වේච්ඡා සංවිධානයක් වන ජාතික අන්ධ ජන සේවා මණ්ඩලය ඉදිරිපත් විය. මෙමගින් ඉතා කුඩා ප්‍රමාණයේ මුද්‍රණාලයක් පිහිටුවා ගන්නා ලදී. එම බ්රේල් මුද්‍රණාලය මගින් දශ්‍යාබාධිතයින් සඳහා තිබූ පත පොත පාසැල් තුළින් නිපදවා ගත් පොත්වලට වඩා ප්‍රමාණවත් ප්‍රමාණයකට මුද්‍රණය කරන ලදී.

## බ්රේල් මුද්‍රණාලය පිහිටුවීම

ඇමරිකානු විදේශ අන්ධ පදනම (AFOB) හෙවත් වර්තමානයේ හෙලන් කෙලර් ජාත්‍යන්තරය නමින් හඳුන්වන සංවිධානය, එවකට ඇමරිකාවේ ක්‍රියාත්මක වූ ඒකීකරණ අධ්‍යාපන ක්‍රමය 1967 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. එමගින් ඇති වූ ඒකීකරණ අධ්‍යාපන වැඩ පිළිවෙලේ ප්‍රබෝධය නිසා දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ අධ්‍යාපනය ඉතා පුළුල් ලෙස ප්‍රචලිත වීමට පටන් ගැනුණි. අධ්‍යාපනයේ එම දියුණුවත් සමඟ ම සෑම නගරයක් පාසා ම පාසල්වල මෙම අධ්‍යාපන ක්‍රමය බිහි විය. එම පාසල්වල ගුරුවරුන්ගේ සිසුන්ගේ අවශ්‍යතාවනට සරිලන පරිදි ප්‍රකාශන නිෂ්පාදනය කිරීමට ජාතික අන්ධ ජන සේවා මණ්ඩලයට ද නොහැකි විය. එමෙන් ම කලට වේලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් ගුණාත්මක භාවයකින් යුතු ප්‍රකාශන එළි දැක්වීමට ජාතික අන්ධ ජන සේවා මණ්ඩලයට නුපුළුවන් විය. එසේ ම පොත් පත් මුද්‍රණය කෙරුණේ ද විද්වතුන්ගේ උපදෙස් නොමැති ව ය. ගුණාත්මක

අතින් ඉතාමත් අවම මට්ටමකින් පැවතීම නිසාත්, සිසුන්, ගුරුවරුන්, දෙමාපියන් තම දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ඇති අඩුපාඩුකම් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒකීකරණ අධ්‍යාපන ක්‍රමයේ නිර්මාතෘවරයකු වන එවකට විශේෂ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන නිලධාරී වශයෙන් කටයුතු කළ කේ. පියසේන මහතාගේ විශේෂ උනන්දුව යටතේ ශ්‍රී ලංකාවේ බරේල් මුද්‍රණාලයක් පිහිටුවීමේ අවශ්‍යතාවක් ඉදිරිපත් වුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ෂියා ආයතනය (ස්වීඩනයේ ආබාධිතයින් සඳහා වන අන්තර් ජාතික සංවිධානය) විශිෂ්ට තත්ත්වයේ බරේල් මුද්‍රණාලයක් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීමට එකඟ විය. ඒ අනුව මූලික සාකච්ඡාවලින් පසුව බරේල් මුද්‍රණාලයක් 1985 ජුනි මාසයේ දී මහරගම ගුරු විද්‍යාලයේ දී, එවකට අධ්‍යාපන ඇමති වශයෙන් කටයුතු කළ රනිල් වික්‍රමසිංහ මහතා විසින් ස්ථාපිත කරන ලදි. මෙම මුද්‍රණාලය ශ්‍රී ලංකාවේ පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, පුහුණුව ආදිය ෂියා ආයතනය මඟින් සිදු කරන ලදි. මීට අමතර ව මෙම මුද්‍රණාලයේ කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම සීඩා ආයතනයෙන් සිදු කරන ලදි. තව දුරටත් එම කාර්යය අවුරුදු පතා සීඩා ආයතනය මඟින්ම සිදු කරනු ලබයි. මේ අනුව ශ්‍රී ලංකාවේ ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා අවශ්‍ය පාසල් පොත් බරේල් මාධ්‍යයෙන් ඔවුන් අතට පත් කෙරේ. 1 වසර සිසුන්ගේ පටන් විශ්වවිද්‍යාල සිසුන් දක්වා අවශ්‍ය පත පොත මෙම මුද්‍රණාලයේ දී මුද්‍රණය කෙරේ. එමෙන් ම ප්‍රාථමික ශ්‍රේණි සඳහා අවශ්‍ය අතිරේක කියවීම් පොත් ද බරේල් මුද්‍රණාලයේ මුද්‍රණය කිරීමට ද හැකි වී තිබේ. ද්විතීයික ශ්‍රේණි සඳහා ද සුළු වශයෙන් එම අතිරේක පොත් නිපදවේ. දැනට පවතින යන්ත්‍ර-සූත්‍රවල ධාරිතාවය අනුව ද සේවක පිරිසේ හිඟකම ආදිය ද පවතින බැවින් වැඩිහිටි අධ්‍යාපනයට අවශ්‍ය වන පොත් පත්, සඟරා ආදිය නිෂ්පාදනය කර සැපයිය නොහැකි වීම ඉතාමත් කණගාටුවට කරුණකි. තවද දෘශ්‍යාබාධිත පාසල් සිසුන් සඳහා අවශ්‍ය සිතියම් දෘශ්‍යාධාරක මේ සඳහා විශේෂිත වූ යන්ත්‍රයක් (Thermoform) මඟින් නිපදවේ. අඩු පෙනුම ඇති සිසුන් සඳහා යොද ගන්නා ලොකු කරන ලද අකුරු ඇති පොත් පත් නිපදවීමට අවශ්‍ය ව ඇත. එබැවින් අනාගතයේ දී එම පොත පත දරුවන් අතරට පත් කිරීමට කටයුතු යෙදීමට සිදු වී ඇත.

වැඩිහිටි සිසුන් සඳහා අවශ්‍ය ව ඇති අතිරේක කියවීම් පොත් මුද්‍රණය ද ඉතා ඉක්මණින් කළ යුතුව තිබේ. එසේ කිරීමට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිකම ඒය ප්‍රමාදයට හේතු වී තිබේ.

මුද්‍රණාලය සතුව පවතින්නේ නවීන යන්ත්‍ර සූත්‍ර නොවන නිසා මුද්‍රණ වේගය ද වැඩි කළ නොහැක. නව තාක්ෂණයට අනුව නිපදවා ඇති නවීන මුද්‍රණ යන්ත්‍ර අප වෙත ලබා ගැනීමට හැකි වුවහොත් අප බලාපොරොත්තු වන ඉලක්කය කරා යාමට අපට එතරම් දුෂ්කර නොමැත.


# පුස්තකාල ප්‍රවෘත්ති

ත්‍රෛමාසික ප්‍රකාශනය

ආරම්භය : 1973

සංස්කරණය ප්‍රකාශනය හා බෙදහැරීම

පර්යේෂණ හා සංවර්ධන අංශය.

**කලාපයක මිල** රු. 7. 50

**වාර්ෂික දායක මිල** රු. 30. 00

(තැ. ගා. සමග)

**දායක මුදල්:**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමින්

**විමසීම් හා ලිපි :**

සභාපති,

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

නිදහස් මාවත,

කොළඹ 07.

දුරකථනය: 698847. 685201

# පර්යේෂණ හා බැඳුනු සාහිත්‍ය ගවේෂණ සේවා

**සුමිත්‍රා තලාකඩ**
පුස්තකාලයාධිපති
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

පර්යේෂණය යනු සුපරීක්ෂාකාරී ලෙස සෝදිසි කිරීමකි. පුළුල් ලෙස අධ්‍යයනය කිරීමකි. නිශ්චිත අරමුණක් කරා උපක්‍රමශීලීව, ප්‍රායෝගිකව හා පරීක්ෂණ මාර්ගයෙන් ලබන අත්දැකීම් හා සොයා ගැනීම් මත යම් නිගමනයකට එළඹීම සඳහා කරනු ලබන වෑයම පර්යේෂණයක් වශයෙන් හඳුන්වා දිය හැකි ය. පර්යේෂණය වඩාත් ඵලදායී වීම සඳහා නිශ්චිත විෂය ක්ෂේත්‍රය සැලසුම් කර ගත් ව්‍යුහයක් මත රඳවා කළ යුතු වෙයි.

පර්යේෂණ කාර්යයෙහි නියුක්ත වූවන් තම අභිමතාර්ථය සඵල කර ගැනීමට උපකාරක වශයෙන් පරිහරණය කරනු ලබන ඉතා වැදගත් ස්ථානයක් වනුයේ උචිත පුස්තකාලය යි. පර්යේෂණය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ වන සම්පූර්ණ වාර්තා, ලිපි, ලේඛන, පොත්, වාර සඟරා, දත්ත සටහන්, පුවත් පත්, සිතියම් ආදි අනේක විධ වූ ප්‍රකාශිත හා ප්‍රකාශයට පත් නොවූ ලේඛන තම කාර්යය සඳහා පර්යේෂකයා විසින් පරිශීලනය කළ යුතු වෙයි. සාහිත්‍ය ගවේෂණයක් යනු එකී ද්‍රව්‍ය පිළිබඳව සම්පූර්ණ වූත්, විධිමත් වූත් විශ්ලේෂණයකි. මෙනයින් සලකන විට පර්යේෂකයා තම විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීම සඳහා කරනු ලබන සැලසුම් සහගත ව්‍යුහය තරම් ම ඒ සඳහා භාවිත කරනු ලබන මෙවලම් ද වැදගත් වෙයි. පර්යේෂණය සඵල කර ගැනීමට නම් පර්යේෂණයට අදළ හා වැදගත් වූ සියලුම පුස්තකාල ලිපි ලේඛන රැස් කර ගත යුතු වෙයි. එහෙත් මෙහි දී මතු වන ප්‍රශ්නයක් නම් පර්යේෂකයාගේ සීමිත කාලය යි. අදළ සියළුම ලිපි ලේඛන කියවීමට පර්යේෂකයාට වේලාවක් නැත. පර්යේෂකයා වනාහි කාර්ය-බහුල පුද්ගලයෙකි. මේ නිසා අවශ්‍යයෙන් ම තම පර්යේෂණයට කියවිය යුතු ද්‍රව්‍ය පමණක් තෝරා බේරා ගැනීම ද විශේෂ කාර්යයක් වෙයි. පර්යේෂකයා ද්විත්වකරණයෙන් වැළකීම ද අවශ්‍ය වෙයි. මක් නිසා ද යත්, පර්යේෂකයාගේ ප්‍රයත්නය විය යුත්තේ යථාර්ථය දැක්වීම පමණක් නොව අලුත් යමක් විෂය ක්ෂේත්‍රයට ඇතුළත් කිරීම ද වීම ය. මේ හේතු නිසා අදළ සාහිත්‍ය ගවේෂණය කිරීමක් අවශ්‍ය වෙයි.

සාහිත්‍ය ගවේෂණය අල්පේච්ඡ දැනුමක් ඇතිව කළ නොහැකි ය. විෂය පිළිබඳ දැනුමත්, සාහිත්‍ය ගවේෂණය පිළිබඳ මනා පරිචයකුත් ඒ සඳහා අවශ්‍ය වෙයි. විෂය මාතෘකාව හඳුනා ගැනීම සාහිත්‍ය ගවේෂණ ක්‍රියාවලියේ ප්‍රථම පියවර විය යුතු ය. විෂය දැනුම අවශ්‍ය වන්නේ විෂය මාතෘකාව පිළිබඳ සම්පූර්ණ අවබෝධයකින් කළයුතු බැවිනි. උදාහරණ වශයෙන් ''ළමා සුරැකුම'' පිළිබඳව කරනු ලබන ගවේෂණයක් සඳහා විෂයයට අමතරව සෑම අංශයක් ගැනම මනා අවබෝධයක් තිබිය යුතු ය. ළදරු මරණ හා ළදරුවන් පිළිබඳව පමණක් නොව ළදරු මරණවල ස්වභාවය, ප්‍රතිශතය හා නැමියාව ආදි සංඛ්‍යාත්මක කරුණු මෙන් ම සමාජ, ආර්ථික ප්‍රශ්න හා එහි බලපෑම ආදිය ද ළදරු ලෙඩ රෝග ගැන ද වශයෙන් ''ළමා සුරැකුම' මාතෘකාවට අදළ සියලු පැති ගැන අවබෝධය අවශ්‍ය වෙයි. සාහිත්‍ය ගවේෂණ ක්‍රියාවලියේ දෙවන පියවර විය යුත්තේ අදළ මූලාශ්‍ර එක්රැස් කිරීම යි.

මූලාශ්‍රයන් වර්ග 3කට බෙද දැක්විය හැකි ය.

**(1) ප්‍රාථමික මූලාශ්‍ර**

**(2) ද්විතීයික මූලාශ්‍ර**

**(3) තෘතීයික මූලාශ්‍ර වශයෙනි**

ප්‍රලේඛන රටාව ගැන විමසිලිමත් වීමේ දී ප්‍රාථමික මූලාශ්‍ර යනු යම්කිසි පර්යේෂණයක ප්‍රතිඵල මූලිකව ම දෙනු ලබන සාහිත්‍ය වර්ගය යි. එනම්,

**(1.1) පර්යේෂණ වාර්තා**

**(1.2) සම්මන්ත්‍රණ සම්මේලන වාර්තා**

**(1.3) වෙළඳ ප්‍රකාශන**

**(1.4) පේටන්ට් පත්‍ර**

**(1.5) උපාධි නිබන්ධන වැනි සාහිත්‍ය** වෙයි. පර්යේෂණයකින්, සාකච්ඡා සම්මේලනයකින්, පරීක්ෂණයකින් ලැබෙන ප්‍රතිඵල ක්ෂණිකව නිපදවනු ලබන්නේ මේ ස්වරූපයෙනි. ප්‍රාථමික මූලාශ්‍ර වැනි උපුටා ගත් කරුණු ආශ්‍රය කර ගනිමින් ද්විතීයික මූලාශ්‍ර බිහි වෙයි. එනම්,

**(2.1) පාඨ ග්‍රන්ථ**

**(2.2) වාර සඟරා**

**(2.3) විශ්ව කෝෂ**

**(2.4) ශබ්ද කෝෂ**

**(2.5) දත්ත අත්පොත්**

**(2.6) වාර්ෂික ග්‍රන්ථ**

**(2.7) සඟරා සමාලෝචන, විවේචන ආදිය යි.**

තෘතීයික මූලාශ්‍ර වශයෙන් හැඳින්විය හැකි වන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් කරා යොමු කර වීමට ග්‍රන්ථ විද්‍යාත්මකව සකස් කරනු ලැබූ සාහිත්‍ය වර්ගයකි. එනම්,

**(3.1) සාර සංග්‍රහ, අනුක්‍රමණිකා**

**(3.2) වාර සඟරා පිළිබඳ කෝෂ ග්‍රන්ථ**

**(3.3) ග්‍රන්ථ නාමාවලි**

**(3.4) ග්‍රන්ථ නාමාවලී පිළිබඳ ග්‍රන්ථ නාමාවලි**

**(3.5) නියමු ග්‍රන්ථ ආදිය යි.**

මේ හැරුනු විට තවත් විඥපන මූලාශ්‍රයන් වෙයි. එනම්

**(අ) විෂය ක්ෂේත්‍රයේ විශේෂඥයින් හමු වීම**

**(ආ) සම්මන්ත්‍රණ, දේශන ආදියට සහභාගි වීම ආදිය යි.**

කථිකාචාර්යවරු, උපදේශක වරු, අධිකරණ නිලධාරින් ආදීන් දෙනු ලබන උපදෙස් ද සාහිත්‍ය ගවේෂණය කරන්නාට අතිශය උපකාරී විය හැකි වෙයි. සාහිත්‍ය ගවේෂණයන්ට ප්‍රවිෂ්ට වීමට පළමුවෙන් ම කළ යුතු වන්නේ මෙවැනි විශේෂඥවරු හමු වීම හා අදළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව ලියැවුන වැදගත් ම ලිපි ආදිය කියවීම මඟින් විෂය මාතෘකාව පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීම ය. අනතුරුව තොරතුරු රැස් කිරීම ආරම්භ කිරීම කළ යුතු වෙයි. විෂයට අදල සියලුම ද්‍රව්‍ය කියවීමට පර්යේෂකයාට වේලාවක් නැත. එබැවිනි සංවිධානාත්මක සාහිත්‍ය ගවේෂී සේවාවක් අවශ්‍ය වන්නේ.

අනවශ්‍ය දෑ කියවීම පර්යේෂකයාගේ අගනා කාලය නාස්ති වීයාමකි. එමෙන් ම අදළ ලිපි ලේඛන අතුරින් වඩාත් ම වැදගත් දේ තෝරා ගැනීම ද බෙහෙවින් ම ප්‍රයෝජනවත් වෙයි. අතර වාරයේ ලැබෙන පොත් පත් කියවීමට හෝ පොත් රාක්ක වෙත ගොස් බැලීමෙන් පමණක් සාර්ථක ලෙස පර්යේෂණයට අදළ ද්‍රව්‍ය ලැබෙන්නේ නැත. ග්‍රන්ථ විද්‍යාත්මකව කෙරුණ ග්‍රන්ථ නාමාවලි, සාර සංග්‍රහ ආදිය මඟින් අදළ ද්‍රව්‍ය වෙත යොමු කරන කෙටි ක්‍රම ආදිය ද දක්ෂ ගවේෂකයා අත්දැකීමෙන් ම හඳුනා ගනියි. එමෙන් ම එක ම තොරතුරක් අඩංගු ලේඛන 2 ක් කියවීමට පර්යේෂකයාට අවශ්‍ය නොවේ. **මේ නිසා ප්‍රයෝජනවත් විය හැකි, හා ඉතාමත් ප්‍රයෝජනවත් විය හැකි හා අවශ්‍යයෙන් ම ප්‍රයෝජනවත් විය හැකි,** මූලාශ්‍ර වෙන් වශයෙන් හඳුනා ගත යුතු ය. සාහිත්‍ය ගවේෂකයාට මේ කාර්යය සඳහා මූලිකව උපකාර වන ද්‍රව්‍ය සමහරක් නම්,

**(අ) පුස්තකාල සූචි**

**(ආ) මුද්‍රිත ග්‍රන්ථ නාමාවලි**

**(ඇ) පරිගණක දත්ත පදනම් ආදිය වේ.**

පුස්තකාල සූචි බොහොමයක් ම ඩිවි දශම වර්ගීකරණය හෝ කොංග්‍රස් පුස්තකාලයීය වර්ගීකරණය භාවිතා කර ඇති බව පෙනේ. මේවායේ සම්මත සූචිකරණය ක්‍රමයක් භාවිතා කරමින් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර සපයා ඇත. කර්තෘ, ග්‍රන්ථ නාමය හා විෂය අනුක්‍රමණිකතා මඟින් ඒ ඒ පුස්තකාලයේ ඇති ද්‍රව්‍යයන්ට ළඟාවීම දැක්වේ. මුද්‍රිත ග්‍රන්ථ නාමාවලි මඟින් තම විෂය ක්ෂේත්‍රයට අදළ තව තවත් ද්‍රව්‍ය ලබා ගත හැකි ස්ථාන කරා යොමු කෙරේ. නවීන තාක්ෂණ දියුණුව උපයෝගී කර ගනු ලැබූ පුස්තකාලවලින් පරිගණක ඇසුරෙන් ඉතා කාර්යක්ෂම සේවාවක් පර්යේෂකයාට ලබා ගත හැකි ය. දුරස්ථ සේවා මඟින් මෙන් ම මුද්‍රිත ප්‍රකාශන වශයෙන් ද විෂය මාතෘකාවට අදල සියලුම ද්‍රව්‍ය යම්කිසි අවශ්‍ය පිළිවෙළකට සකස් කර දීම පරිගණක ඇසුරෙන් වඩාත් කාර්යක්ෂම ව ක්ෂණිකව සිදු වේ. **ERIC, MEDLARS, POPIN** වැනි දියුණු දත්ත පද්ධති මඟින් මෙවැනි කාර්යක්ෂම සේවා සැපයේ.

1988 දී ඕස්ට්‍රේලියාවේ දී උපාධි නිබන්ධන සඳහා වන සාහිත්‍ය ගවේෂණයක් සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 40,000 ක් අය කෙරිණ. පුස්තකාල සේවා නවීකරණය වීම හා සසඳන විට මෙබඳු සේවා පුස්තකාල ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමේ ලා උපකාරී වී ඇති බව ද පැහැදිලි ය. පොපින් දත්ත පද්ධතිය මඟින් සාමාජික රටවලට නොමිලයේ සාහිත්‍ය ගවේෂණ සේවාවන් සපයයි. ජනගහණය පිළිබඳව වන පර්යේෂණයන්ට මෙම දත්ත පද්ධති උපයෝගී කර ගනිමින් සාහිත්‍ය ගවේෂණය කිරීමට ශ්‍රී ලංකාවේ ද වරම් ලැබී ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනගහණ තොරතුරු මධ්‍යස්ථානය පොපින් ජාල පද්ධතියෙහි සාමාජිකත්වය උසුලන බැවිනි.

සාහිත්‍ය ගවේෂණයෙහි මීළඟ පියවර විය යුත්තේ මෙලෙස අනේක විධ මූලාශ්‍රයන් මඟින් එක් රැස් කර ගත් ද්‍රව්‍ය අතුරින් පර්යේෂකයාට අවශ්‍ය මූලාශ්‍ර කෙරෙහි පර්යේෂකයාට ටිප්පණි සහිත සමාලෝචන ආදිය ඉදිරිපත් කිරීමත් අනුක්‍රමණිකතා, සාර සංග්‍රහ ආදිය සකස් කිරීමටත් අවශ්‍ය නිර්දේශ පත්‍රිකා සකස් කිරීමටත් සිදු වෙයි. විමර්ශන වාර්තාවක් සකස් කිරීම මෙහි දී අදහස් කෙරේ. එක්රැස් කර ගත් ද්‍රව්‍ය පිළිබඳව සාරාංශ ඉදිරිපත් කළ යුතු ය. බොහෝ විට සඟරා ලිපිවල සාරාංශය කෙළින්ම දී ඇත. එය පිටපත් කර දැක්වීම වරදක් නොවේ. ඇමෙරිකාව හා යුරෝපා රටවල පරිවර්තන කාර්යය කෙරෙන මධ්‍යස්ථාන ඇත. ඒවායින් ලබා ගැනීම පහසු ය. විධිමත් වූ විමර්ශන වාර්තාවක් සකස් කිරීම දක්ෂ සාහිත්‍ය ගවේෂකයින්ගේ කාර්යක්ෂමතාව විදහා දක්වයි. සාහිත්‍ය ගවේෂණය විමර්ශන සේවාවට හා පර්යේෂණයේ අතරමැදි ක්‍රියාවලියන් ලෙස සැලකිය හැකි ය.

නූතන දියුණු පුස්තකාලයන්හි සාහිත්‍ය ගවේෂණ සඳහා ම වෙන් වූ කුටි ඇත. ඒවායේ වැදගත් ග්‍රන්ථ නාමාවලී, අනුක්‍රමණිකතා, සාර සංග්‍රහ ආදිය දක්නට ලැබේ. එමෙන් ම නවීන දියුණු පුස්තකාලවල පරිගණක භාවිතය ඇත. එබැවින් සාහිත්‍ය ගවේෂණ සේවාව දියුණු රටවල ව්‍යාප්ත වී ඇති බව පෙනේ. එහෙත් ශ්‍රී ලංකාවේ එම සේවාව කෙරෙහි උනන්දුවක් නොදැක්වීම කණගාටුවට කරුණකි. සාහිත්‍ය ගවේෂණය පිළිබඳව මනා පුහුණුවක් ලබා දීම කාලෝචිත ය. පුස්තකාල සේවා දියුණු කිරීම පිළිබඳව වගකවයුත්තන්ගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු වීම අවශ්‍ය ය.

*REFERENCES*


(1) Demography Teaching Notes 6 Canberra, The Australian National University 1989

(2) Looking at the Population Literature Davidlucas, Christine Mc Murray Kim Steatfied

(3) Research Method in Librarianship Techniques and Interpretation by Charles S Buscha & Steivan R Hunter

(4) Websters New Collegiate Dictionary

# පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල
# ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

**ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙළ අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් මෑතකදී පළ කර ඇත.**

| | |
|---|---|
| **සමාජ විද්‍යාව** | |
| මහාචාර්ය තිස්ස කාරියවසම් | ශ්‍රී ලංකාවේ දේවතාවියෝ සහ යකින්නියෝ |
| Prof. V. Vitharana | The Oru and the Yatra |
| **නීතිය** | |
| S. D. S. Kariyawasam | The Liability of Port Authorities For Loss of or Damage to Cargo |
| **අධ්‍යාපනය** | |
| සමරසිංහ ගුණසේකර | වෘත්තීය සංවර්ධනයට නව ප්‍රවේශයක් |
| මහාචාර්ය හෙන්රි වීරසිංහ | අධ්‍යාපන චින්තනය |
| **කළමනාකරණය** | |
| ඩී. එම්. තිලකරත්න බණ්ඩා | පාසල් කළමනාකරණයේ මූලිකාංග |
| **සාහිත්‍ය** | |
| මහාචාර්ය සුනිල් ආරියරත්න | දෙමළ සාහිත්‍ය ඉතිහාසය |
| මහාචාර්ය විමල විජේසූරිය | අනුරපුර යුගයේ විශ්ව කීර්තිමත් සිංහල මහා ලේඛකයෝ |
| **පරිවර්තන (නිර්මාණ)** | |
| ඉ. කොලොන්නගේ | රොඩී කෙල්ල |
| [Jinadasa Wijetunga] | [Rodiya Girl and Other Stories] |
| ගාමිනී විජේතුංග | අර්ජුන් |
| [Sunil Gangopadya] | [Arjun] |
| කුසුම් දිසානායක | ගීතාංජලී |
| [Rabindranath Tagore] | [Geethanjali] |
| **නවකතා** | |
| දෙනගම සිරිවර්ධන | මිතුරෝ |
| **කෙටිකතා** | |
| කරුණාරත්න අමරසිංහ | වහලකුගේ කතාව හා තවත් කතා |
| **නාට්‍ය** | |
| සෝමලතා සුබසිංහ | විකෘති |



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල
සේවා මණ්ඩලය පැවැත් වූ
සිංහල අළුත් අවුරුදු
උත්සවය
இலங்கை தேசிய நூலக
சேவைகள் சபையில்
நடைபெற்ற புத்தாண்டு
விளையாட்டு நிகழ்ச்சி
New year Festival at the SLNLSB
1992. 04. 23



⇧
මහජන පුස්තකාලයාධිපති -
පුහුණු පාඨමාලාව - ඇඹිලිපිටිය
பொதுசன நூலகர்களுக்கான
பயிற்சித் திட்டம் -
எம்பிலிப்பிட்டிய
Public Librarians Training Programme-
Embilipitiya
1992. 04. 05 - 09



මහජන පුස්තකායාධිපති පුහුණු
පාඨමාලාව - කුරුණෑගල
பொதுசன நூலகர்களுக்கான
பயிற்சித் திட்டம் - குருநாகல்
Training Programme for
Public Librarians - Kurunegala
1992. 05. 09 - 10




5. 2. 1. 4. 3.

1. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය இலங்கை தேசிய நூலக The National Library of Sri Lanka
2. කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය நூலகம் - கொழும்பு பல்கலைக்கழகம் The Library - University of Colombo
3. ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය இலங்கை விஞ்ஞான கைத்தொழில் ஆராச்சி நிறுவனம் Ceylon Institute of Scientific and Industrial Resea
4. කොළඹ මහජන පුස්තකාලය கொழும்பு பொதுசன நூலகம் Colombo Public Library
5. ජාතික කෞතුකාගාරය தேசிய அரும்பொருட்காட்சிச்சாலை National Museum

කා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින්
ගොඩ, ගංගොඩවිල, දීපානී මුද්‍රණාලයේ මුද්‍රණය කරවා පළ කරන ලදී.

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/10/10

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*